# අභිධර්මය.

## (ප්‍රථම භාගය)

№ 19331

## චිත්තකාණ්ඩය.

---

ප්‍රකාශක:-

කොළඹ තරුණ බෞද්ධ සමිතිය

---

(පළමුවන මුද්‍රණය.)

---

ශ්‍රී: බු: ව: 2499.

ක්‍රි: ව: 1955.

මිල ශත 40 යි. පිටපත් 30,000 යි.

# සැලකිය යුතුයි.

---

බෞද්ධ ශිෂ්‍ය විභාගය පිළිබඳ සතර වැනි පංක්තියේ විභාගයට නියමිත වනුයේ මෙම පොතේ පළමු වැනි පාඩමේ සිට [ ] මේ වරහන්වලින් වෙන් නො කළ කොටස් පමණෙකි.

ජ්‍යෙෂ්ඨ පංක්තියේ විභාගයට සහ බෞද්ධාචාර්ය විභාගයට එසේ වරහන් තුළ සඳහන් කොටස් ද අයත් වේ.

1953 වර්ෂයට පෙර මුද්‍රිත පොත් භාවිතා කරන අය ඒ ඒ වර්ෂයේ නිර්දේශ පත්‍රයේ සඳහන් පරිදි එම පොත් භාවිතා කළ යුතුයි.

Scanned with CamScanner

# අභිධර්මය:

## (ප්‍රථම භාගය)

## චිත්ත කාණ්ඩය.

සම්පාදක:-
කොළඹ දෙමටගොඩ මහාවිසුද්ධාරාම
ත්‍රිපිටක විද්‍යාලයාධිපති
ආචාර්ය දෙව්නුවර ඤාණාවාස
ස්වාමිපාදයන් වහන්සේ

ප්‍රකාශක:-
කොළඹ තරුණ බෞද්ධ සඞ්ගමය.

(පස්වන මුද්‍රණය)

ශ්‍රී: බු: ව: 2499.
ක්‍රි: ව: 1955.

ඒ. එස්. ඩබ්ලිව්. සිරිවර්ධන
ශ්‍රීපාද් වෙළඳ සැල
130 මරදාන පාර, මරදාන

Scanned with CamScanner

# නිවේදනය.

---

කොළඹ තරුණ බෞද්ධ සඞ්ගමය මගින් වර්ෂයක් පාසා පවත්වනු ලබන බෞද්ධධර්මවිභාග විභාගයෙහි බෞද්ධ මහ ජනයාගේ මහත් අපෙක්ෂාවක් පවතී. මේ විභාගයෙහි 4 වැනි, 5 වැනි, 6 වැනි සහ 7 වැනි පඞ්ක්තීන්ට අභිධර්මයද එක් විෂයෙකි. එහෙත් ඒ සඳහා අප සඞ්ගමය මගින් විශෙෂයෙන් පොතක් මේතාක් පිළියෙළ නො වීය. මෙය ගුරු ශිෂ්‍ය දෙපක්ෂයටම මහත් පීඩාවක්ව පැවැතිණ.

එබැවින් අභිධර්මය සම්බන්ධ විභාගයට අනුකූල පරිදි ශිෂ්‍යයන්ගේ ඉගෙනීම පිණිස අභිධර්ම පොත් පෙළක් සපයා දෙන මෙන් කොළඹ දෙමටගොඩ මහාවිශුද්ධාරාම ත්‍රිපිටක විද්‍යාලයාධිපති ගරු කටයුතු **දෙවිනුවර ඥාණාවාස** මහා ස්ථවිරපාදයන් වහන්සේට ආරාධනය කෙළෙමු.

අභිධර්මය සම්බන්ධ මෙබඳු පොත් පඞ්ක්තියක් සැපයීම වහා කළ හැක්කක් නො වේ. මේ සඳහා මහත් වෙහෙසීමක් හා කාලයක් ද උවමනා කෙරේ. එහෙත් ඥාණාවාස ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ කරුණා ගුණය හේතුකොට පොත් පෙළෙහි පළමු පොත මුද්‍රණයෙන් ප්‍රචාරයට පමුණුවන්ට හැකිවීම බලවත් ප්‍රීතියකි. මේ විභාගයට ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ගේ භාග්‍යයෙකි.

අපගේ බුදුපියාණන් වහන්සේගේ ඥාණමහිමය සහ ලොකතත්ත්වයත් ප්‍රකටවන අභිධර්ම ග්‍රන්ථ පඞ්ක්තිය කාලානුරූප ලෙස සම්පාදනයකර දීමට පිළිගෙන වදාළ **දෙවිනුවර ඥාණාවාස** මහා ස්ථවිරපාදයන් වහන්සේට අපේ ගෞරවාදර ස්තුතිය ඉතා අවනතභාවයෙන් පිරිනමමු.

මීට-ශාසනස්ථිතිකාමී,

**ඒ. ජයසිංහ,**

**බෞද්ධ ධර්ම විභාග ගරු ලේකම් තැන.**

**වර්ෂ 1950 ක්වූ අගෝස්තු මස 20 වෙනි දින**
**කොළඹ තරුණ බෞද්ධ**
**සමිති කාර්යාලයේ දීය.**

# සංඥාපනය.

අභිධර්මය නමැති මේ පොත අනුරුද්ධ මාහිමියන් අභිධර්ම පිටකයට කළ "අභිධම්මත්ථසඞ්ගහ" නම් අත් (අටුවා) පොතට අනුව, කොළඹ තරුණ බෞද්ධ සඞ්ගමයේ බෞද්ධ ධර්ම විභාග පිළිබඳ ගරු ලේකම් තැන්පත් **ඒ. ජයසිංහ මහත්මාගේ** ආරාධනයෙන් සම්පාදිත ය.

පිරිවිදින දහම් පාසැල්හි සතරවැනි **පඞ්ක්තියට** නියමිත චිත්තකාණ්ඩය මේ ප්‍රථමභාගයෙහි දැක්වේ. ඉහළ පඞ්කතීන් උදෙසා ද මෙය කොටස් වශයෙන් ලියනු ලැබේ.

මෙහි මොහමූල සිත් හා අහෙතුක සිත් අසංඛාරිකයී ද මහග්ගත ලොකොත්තර සිත් සසංඛාරිකයී ද අප සඳහන් කළේ ස්වරූප බෙදීමේ පහසුව සලකාගෙනයි.

ස්වරූප විභාගය අභිධර්මඥානයේ පිරිසුදුබවට අත්‍යාවශ්‍යකය. නාමරූප පරිච්ඡේද ඥානය ලැබෙන්නේ එවිටය. එය නිවන ලැබීමට ඉවහල්ය. එහෙයින් ස්වරූප විභාගය අභිධර්මය ඉගැන්වීමෙහි දී ඉතා උවමනා කරුණක් බව විශෙෂයෙන් සැලකිය යුතුය.

අපගේ ආචාර්ය මහා විසුද්ධාරාම **ත්‍රිපිටක විද්‍යාලය** සෙනි ආදිකර්තෘභූත **අභිධර්ම විශාරද අරඹගල සිරිධම්ම** මහා ස්වාමිපාදයන් වහන්සේගේ ආචාර්ය පරම්පරාවේ වාචනා මාර්ගක්‍රමය මේ පොත ලිවීමේදී අනුගමනය කළ බව මෙහි ලා විශෙෂයෙන් මතක් කරමු.

මේ ග්‍රන්ථය සම්පාදනය කිරීමේ දී **ආභිධම්මිකාචාරිය ඇන්. ආර්. සිරිසේන වෙදුරු මහත්මාණන්** ගේ උපෂ්ටම්භය ලැබුණු බව කෘතඥතා පූර්වකව සඳහන් කරමි.

මෙයට,

**දෙව්නුවර ඥානාවාස (ස්ථවිර)**

2494
—— අගෝස්තු 20 ද,
1950 කොළඹ දෙමටගොඩ,
**මහා විසුද්ධාරාම ත්‍රිපිටක විද්‍යාලයයේ දීය.**

HEMAL DE ALWIS

# අභිධම්මත්ථසඞ්ගහ.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

1 සම්මාසම්බුද්ධම’තුලං–සසද්ධම්මගණුත්තමං,
අභිවාදිය භාසිස්සං – අභිධම්මත්ථ සඞ්ගහං.

(පරමාර්ථ 4)

2 තත්ථ වුත්තා’භිධම්මත්ථා – චතුධා පරමත්ථතො,
චිත්තං චෙතසිකං රූපං – නිබ්බානමි’ති සබ්බථා.

3 තත්ථ චිත්තං තාව චතුබ්බිධං හොති කාමාවචරං රූපාවචරං අරූපාවචරං ලොකුත්තරඤ්චෙ’ති.

(අකුසල් සිත් 12)

4 තත්ථ කතමං කාමාවචරං? සොමනස්ස සහගතං දිට්ඨිගතසම්පයුත්තං අසඞ්ඛාරිකමෙ’කං සසඞ්ඛාරික-මෙ’කං. සොමනස්ස සහගතං දිට්ඨිගතවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙ’කං සසඞ්ඛාරිකමෙ’කං උපෙක්ඛාසහගතං දිට්ඨිගතසම්පයුත්තං අසඞ්ඛාරිකමෙ’කං සසඞ්ඛාරිකමෙ’කං උපෙක්ඛාසහගතං දිට්ඨිගතවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙ’කං. සසඞ්ඛාරිකමෙක’ංති ඉමානි අට්ඨ’පි ලොභසහගත චිත්තානි නාම.

5 දොමනස්සසහගතං පටිඝසම්පයුත්තං අසඞ්ඛාරිකමෙ’කං සසඞ්ඛාරිකමෙකං’ති ඉමානි ද්වෙ’පි පටිඝසම්පයුත්ත චිත්තානි නාම.

6 උපෙක්ඛා සහගතං විචිකිච්ඡා සම්පයුත්තමෙ’කං උපෙක්ඛාසහගතං උද්ධච්චසම්පයුත්තමෙකං’ති ඉමානි ද්වෙ’පි මොමූහචිත්තානි නාම.

7 ඉච්චෙවං සබ්බථා’පි ද්වාදස අකුසලචිත්තානි සමත්තානි.

1 ශ්‍රී සද්ධර්මය හා ආර්ය්‍යසංඝයා සහිත ශීලාදිගුණ හෙයින් කිසිවෙකු හා සම නොවූ සම්මාසම්බුදුන් විශෙෂයෙන් වැඳ අභිධර්මප්‍රකරණ සතෙහි වදාළ අභිධර්මාර්ථයන් හකුළුවා කරනලද හෙයින් **අභිධම්මත්ථසඞ්ගහ** නම් වූ ග්‍රන්ථයක් කියන්නෙමි.

### පරමාර්ථ 4

2 ඒ අභිධර්මපිටකයෙහි කුශලාදිවශයෙන් ද ස්කන්ධාදී වශයෙන් ද යන සර්වප්‍රකාරයෙන් වදාළාවූ අභිධර්මාර්ථයෝ චිත්තය, චෛතසිකය, රූපය, නිබ්බානයයි =සම්මුතිය හැර **පරමාර්ථ වශයෙන්** සතර ආකාරයකින් සිටියාහුය.

3 ඒ පරමාර්ථ සතරින් පළමුකොට චිත්තයතෙම කාමාවචරය, රූපාවචරය, අරූපාවචරය, ලොකුත්තරයයි සිවුවැදෑරුම් වේ.

### අකුසල් සිත් 12

4 එහි කාමාවචර අකුසල චිත්තය කවරේද? සොමනස්ස සහගත දිට්ඨිගතසම්පයුත්ත අසඞ්ඛාරිකචිත්තය එකකි, සසඞ්ඛාරිකචිත්තය එකකි, සොමනස්සසහගත දිට්ඨිගත විප්පයුත්තඅසඞ්ඛාරිකචිත්තය එකකි. සසඞ්ඛාරිකචිත්තය එකකි, උපෙක්ඛාසහගත දිට්ඨිගතසම්පයුත්ත අසඞ්ඛාරිකචිත්තය එකකි, සසඞ්ඛාරිකචිත්තය එකකි, උපෙක්ඛාසහගත දිට්ඨිගතවිප්පයුත්ත අසඞ්ඛාරිකචිත්තය එකකි, සසඞ්ඛාරිකචිත්තය එකකි, යන මොහු අටදෙන ද **ලොභසහගත චිත්තයෝ** නම් වෙත්.

5 දොම්නස්සහගත පටිඝසම්පයුත්ත අසඞ්ඛාරික චිත්තය එකකි, සසඞ්ඛාරිකචිත්තය එකකි, යන මොහු දෙදෙන ද **පටිඝසම්පයුත්ත චිත්තයෝ** නම් වෙත්.

6 උපෙක්ඛාසහගත විචිකිච්ඡාසම්පයුත්ත සිත එකකි, උපෙක්ඛාසහගත උද්ධච්චසම්පයුත්තසිත එකකි, යන මොහු දෙදෙන ද **මොමූහචිත්තයෝ** නම් වෙත්.

7 මෙසේ සර්වප්‍රකාරයෙන් දොළොස් අකුසල චිත්තයෝ සමාප්තයහ.=කියා නිමවන ලදහ.

8 අට්ඨධා ලොභමූලානි – දොසමූලානි ච ද්විධා,
මොහමූලානි ච ද්වෙ'ති ද්වාදසා' කුසලා සියුං

(අහෙතුක සිත් 18)

9 උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණං, තථා සොත විඤ්ඤාණං, ඝාණවිඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණං, දුක්ඛසහගතං කායවිඤ්ඤාණං, උපෙක්ඛාසහගතං සම්පටිච්ඡනචිත්තං, උපෙක්ඛාසහගතං සන්තීරණචිත්තංචෙ'ති ඉමානි සත්ත'පි, අකුසලවිපාකචිත්තානි නාම.

10 උපෙක්ඛාසහගතං කුසලවිපාකං චක්ඛුවිඤ්ඤාණං, තථා සොතවිඤ්ඤාණං, ඝාණවිඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණං, සුඛසහගත කායවිඤ්ඤාණං, උපෙක්ඛාසහගතං සම්පටිච්ඡන චිත්තං සොමනස්සසහගතං සන්තීරණචිත්තං, උපෙක්ඛාසහගතං සන්තීරණචිත්තඤ්චෙ'ති ඉමානි අට්ඨ පි කුසල විපාකා'හෙතුක චිත්තානි නාම.

11 උපෙක්ඛාසහගතං පඤ්චද්වාරාවජ්ජන චිත්තං, තථා මනොද්වාරාවජ්ජනචිත්තං, සොමනස්සසහගතං හසිතුප්පාද චිත්තඤ්චෙ'ති ඉමානි තීණි'පි අහෙතුක කිරිය චිත්තානි නාම.

12 ඉච්චෙවං සබ්බථාපි අට්ඨාරස අහෙතුකචිත්තානි සමත්තානි.

13 සත්තා'කුසලපාකානි – පුඤ්ඤපාකානි අට්ඨධා,
ක්‍රියා චිත්තානි තීණී'ති – අට්ඨාරස අහෙතුකා.

(සොභන සිත්)

14 පාපා'හෙතුක මුත්තානි – සොභනා'තීති වුච්චරෙ
එකූනසට්ඨි චිත්තානි – අථෙ'කනවුතී පි වා,

8 ලෝභමූලසිත් අට 8 ය දෙසමූලසිත් දෙක 2 ය මොහමූලසිත් දෙක 2 යයි **අකුසල සිත් දොළොසෙක්** වෙත්.

### අහෙතුක සිත් 18

9 උපෙක්ඛාසහගත චක්ඛුවිඤ්ඤාණය ද, එසේම උපෙක්ඛාසහගත සොතවිඤ්ඤාණය ද, ඝාණවිඤ්ඤාණයද, ජිව්හාවිඤ්ඤාණය ද, දුක්ඛසහගත කායවිඤ්ඤාණය ද, උපෙක්ඛාසහගත සම්පටිච්ඡනචිත්තය ද උපෙක්ඛාසහගත සන්තීරණචිත්තය ද යන මොහු සත්දෙන **අකුසලවිපාක චිත්තයෝ** නම් වෙත්.

10 කුසලවිපාක උපෙක්ඛාසහගත චක්ඛුවිඤ්ඤාණයද, එසේම උපෙක්ඛාසහගත සොතවිඤ්ඤාණය ද, ඝාණ-විඤ්ඤාණය ද, ජිව්හාවිඤ්ඤාණය ද, සුඛසහගත කාය-විඤ්ඤාණය ද උපෙක්ඛා'සහගත සම්පටිච්ඡනචිත්තය ද, සොමනස්සසහගත සන්තීරණචිත්තය ද, උපෙක්ඛාසහගත සන්තීරණචිත්තය ද යන මොහු අටදෙන ද **කුසලවිපාක අහෙතුකචිත්තයෝ** නම් වෙත්.

11 උපෙක්ඛාසහගත පඤ්චද්වාරාවජ්ජනචිත්තය ද, එසේම මනොද්වාරාවජ්ජනචිත්තය ද, සොමනස්සසහගත හසිතුප්පාදචිත්තය ද යන මොහු තිදෙන ද **අහෙතුක කිරිය චිත්තයෝ** නම් වෙත්.

12 මෙසේ සර්වප්‍රකාරයෙන් අටළොස් අහෙතුක චිත්තයෝ සමාප්තයහ.

13 අකුසලවිපාක සිත් සත 7 ය, කුසලවිපාක සිත් අට 8 ය, කිරියසිත් තුණ 3 යයි අහෙතුකචිත්තයෝ අටළොස 18 ක් වෙත්.

### සොභන සිත්

14 අකුසලසිත් දොළොස 12 ය, අහෙතුකසිත් අට ළොස 18 ය යන මොවුන් කෙරෙන් මුක්ත=වෙන් වූ එකුන්සැට 59 ක් වූ හෝ එක් අනූවක් 91 වූ චිත්තයෝ **සොභනචිත්තයහයි** කියනු ලැබෙත්.

(කාම සෝභන සිත් 24)

15 සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, සොමනස්සසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං'ති ඉමානි අට්ඨ'පි කාමාවචර කුසල චිත්තානි නාම.

16 සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, සොමනස්සසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරික මෙකං, උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං'ති ඉමානි අට්ඨ'පි සහෙතුක කාමාවචර විපාකචිත්තානි නාම.

17 සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, සොමනස්සසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං'ති ඉමානි අට්ඨ'පි සහෙතුක කාමාවචර කිරියචිත්තානි නාම.

18 ඉච්චෙවං සබ්බථාපි චතුවීසති සහෙතුක කාමාවචර කුසල විපාක කිරියචිත්තානි සමත්තානි.

19 වෙදනා ඤාණ සඞ්ඛාර–භෙදෙන චතුවීසති,
සහෙතුකාමාවචර–පුඤ්ඤ පාක ක්‍රියා මතා.

(කාම සිත් පිඩුකිරීම)

20 කාමෙ තෙවීස පාකානි – පුඤ්ඤා'පුඤ්ඤානි වීසති,
එකාදස ක්‍රියා චෙ'ති – චතුපඤ්ඤාස සබ්බථා.

Scanned with CamScanner

### කාම සොභන සිත් 24

15 සොම්නස්සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත එකකි, සසඞ්ඛාරිකසිත එකකි, සොම්නස්සහගත ඤාණවිප්ප යුත්ත අසඞ්ඛාරික සිත එකකි, සසඞ්ඛාරිකසිත එකකි, උපෙක්ඛාසහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරිකසිත එකකි, සසඞ්ඛාරිකසිත එකකි, උපෙක්ඛාසහගත ඤාණ විප්පයුත්ත අසඞ්ඛාරිකසිත එකකි, සසඞ්ඛාරිකසිත එකකි, යන මොහු අටදෙන **කාමාවචර කුසල චිත්තයෝ** නම් වෙත්.

16 සොම්නස්සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත එකකි, සසඞ්ඛාරිකසිත එකකි, සොම්නස්සහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරිකසිත එකකි, සසඞ්ඛාරිකසිත එකකි, උපෙක්ඛාසහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරිකසිත එකකි, සසඞ්ඛාරික සිත එකකි, උපෙක්ඛාසහගත ඤාණ විප්පයුත්ත අසඞ්ඛාරිකසිත එකකි, සසඞ්ඛාරිකසිත එකකි, යන මොහු අටදෙනද **සහෙතුක කාමාවචරවිපාක චිත්තයෝ** නම් වෙත්.

17 සොම්නස්සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත එකකි, සසඞ්ඛාරිකසිත එකකි, සොම්නස්සහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරිකසිත එකකි. සසඞ්ඛාරිකසිත එකකි, උපෙක්ඛාසහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරිකසිත එකකි, සසඞ්ඛාරිකසිත එකකි, උපෙක්ඛාසහගත ඤාණ විප්පයුත්ත අසඞ්ඛාරිකසිත එකකි, සසඞ්ඛාරිකසිත එකකි, යන මොහු අටදෙන ද **සහෙතුක කාමාවචර කිරිය චිත්තයෝ** නම් වෙත්.

18 මෙසේ සර්වප්‍රකාරයෙන්ම සූවිස්සක්වූ කාමාවචර කුසල් සහ සහෙතුක කාමාවචර විපාක කිරියචිත්තයෝ සමාප්තයහ.

19 කාමාවචරකුසල් හා සහෙතුක කාමාවචර විපාක කිරියචිත්තයෝ වෙදනාභෙද, ඤාණභෙද, සංඛාරභෙද යෙන් සූවිස්ස 24 කැයි දත්තාලදහ.

### කාමසිත් ජාතිභෙදයෙන් පිඬුකිරීම

20 කාමභවයෙහි විපාකසිත් තෙවිස්ස 23 කි, කුසල් සිත් අට 8 කි, අකුසල්සිත් දොළොස 12 කි, කිරියසිත් එකොළොස 11 කි, මෙසේ සර්වාකාරයෙන් කාමාවචරසිත් සූපණස 54 ක් වේ.

(රූපාවචර සිත් 15)

21 විතක්ක විචාර පීතිසුඛෙකග්ගතා සහිතං පඨම ජ්ඣාන කුසල චිත්තං, විචාරපීතිසුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන කුසලචිත්තං, පීතිසුඛෙකග්ගතා සහිතං තතියජ්ඣානකුසල චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣානකුසලචිත්තං, උපෙක්ඛෙකග්ගතාසහිතං පඤ්චමජ්ඣානකුසලචිත්තඤ්චෙ'ති ඉමානි පඤ්ච'පි රූපාවචර කුසලචිත්තානි නාම.

22 විතක්කවිචාර පීතිසුඛෙකග්ගතාසහිතං පඨම ජ්ඣාන විපාකචිත්තං, විචාරපීතිසුඛෙකග්ගතාසහිතං දුතිය ජ්ඣාන විපාකචිත්තං, පීතිසුඛෙකග්ගතාසහිතං තතිය ජ්ඣාන විපාකචිත්තං, සුඛෙකග්ගතාසහිතං චතුත්ථජ්ඣාන විපාක චිත්තං, උපෙක්ඛෙකග්ගතාසහිතං පඤ්චමජ්ඣාන විපාක චිත්තංචෙ'ති ඉමානි පඤ්ච'පි රූපාවචර විපාක චිත්තානි නාම.

23 විතක්කවිචාර පීතිසුඛෙකග්ගතාසහිතං පඨම ජ්ඣාන කිරියචිත්තං, විචාරපීතිසුඛෙකග්ගතාසහිතං දුතිය ජ්ඣාන කිරියචිත්තං, පීතිසුඛෙකග්ගතාසහිතං තතිය ජ්ඣාන කිරියචිත්තං, සුඛෙකග්ගතාසහිතං චතුත්ථ ජ්ඣාන කිරියචිත්තං, උපෙක්ඛෙකග්ගතාසහිතං පඤ්චම ජ්ඣාන කිරියචිත්තඤ්චෙ'ති ඉමානි පඤ්ච'පි රූපාවචර කිරියචිත්තානි නාම.

24 ඉච්චෙවං සබ්බථා'පි පණ්ණරස රූපාවචරකුසල විපාක කිරියචිත්තානි සමත්තානි.

25 පඤ්චධා ඣානභෙදෙන – රූපාවචරමානසං,
පුඤ්ඤ පාක ක්‍රියාභෙදා – තං පඤ්ච දසධා භවෙ.

(අරූපාවචර සිත් 12)

26 ආකාසානඤ්චායතනකුසලචිත්තං, විඤ්ඤාණඤ්චායතනකුසලචිත්තං, ආකිඤ්චඤ්ඤායතන කුසලචිත්තං, නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලචිත්තඤ්චෙ'ති ඉමානි චත්තාරිපි අරූපාවචරකුසලචිත්තානි නාම.

රූපාවචර සිත් 15

21 විතක්කවිචාර පීතිසුඛඑකග්ගතා සහිත පඨම ජ්ඣාන කුසලසිත ද, විචාරපීතිසුඛඑකග්ගතාසහිත දුතිය ජ්ඣාන කුසලසිත ද, පීතිසුඛඑකග්ගතා සහිත තතිය ජ්ඣාන කුසලසිත ද, සුඛඑකග්ගතාසහිත චතුත්ථජ්ඣාන කුසලසිත ද, උපෙක්ඛාඑකග්ගතා සහිත පඤ්චමජ්ඣාන කුසලසිත ද, යන මොහු පස්දෙන ද **රූපාවචර කුසලචිත්තයෝ** නම් වෙත්.

22 විතක්කවිචාර පීතිසුඛඑකග්ගතා සහිත පඨම ජ්ඣාන විපාකසිත ද, විචාරපීතිසුඛඑකග්ගතා සහිත දුතියජ්ඣාන විපාක සිත ද පීතිසුඛඑකග්ගතා සහිත තතියජ්ඣාන විපාක සිත ද, සුඛ එකග්ගතා සහිත චතුත්ථ ජ්ඣාන විපාක සිත ද, උපෙක්ඛාඑකග්ගතා සහිත පඤ්චම ජ්ඣාන විපාක සිත ද යන මොහු පස්දෙන ද **රූපාවචර විපාකචිත්තයෝ** නම් වෙත්.

23 විතක්කවිචාර පීතිසුඛ එකග්ගතාසහිත පඨම ජ්ඣාන කිරියසිත ද, විචාරපීතිසුඛඑකග්ගතාසහිත දුතිය ජ්ඣාන කිරිය සිත ද, පීතිසුඛ එකග්ගතාසහිත තතිය ජ්ඣානකිරිය සිත ද, සුඛඑකග්ගතාසහිත චතුත්ථජ්ඣාන කිරියසිත ද, උපෙක්ඛාඑකග්ගතාසහිත පඤ්චමජ්ඣාන කිරියසිත ද යන මොහු පස්දෙන ද **රූපාවචර කිරිය චිත්තයෝ** නම් වෙත්.

24 මෙසේ සර්වප්‍රකාරයෙන් පසළොස 15 ක්වූ රූපාවචරකුසල විපාක කිරියචිත්තයෝ සමාප්තයහ.

25 රූපාවචරචිත්තය පඨමජ්ඣානය ආදී ඣාන භෙදයෙන් පස්වැදෑරුම්. එය කුසල විපාක කිරිය භෙදයෙන් පසළොස් 15 වැදෑරුම් වේ.

(අරූපාවචර සිත් 12)

26 ආකාසානඤ්චායතනකුසලසිත ද; විඤ්ඤාණඤ්චායතනකුසලසිත ද, ආකිඤ්චඤ්ඤායතනකුසලසිතද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනකුසලසිතද යන මොහු සතරදෙන ද **අරූපාවචරකුසලචිත්තයෝ** නම් වෙත්.

27 ආකාසානඤ්චායතනවිපාක චිත්තං, විඤ්ඤාණඤ්චායතනවිපාකචිත්තං, ආකිඤ්චඤ්ඤායතනවිපාක චිත්තං, නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාකචිත්තඤ්චෙ'ති ඉමානි චත්තාරි'පි අරූපාවචරවිපාක චිත්තානි නාම.

28 ආකාසානඤ්චායතනකිරියචිත්තං, විඤ්ඤාණඤ්චායතනකිරියචිත්තං, ආකිඤ්චඤ්ඤායතනකිරියචිත්තං, නෙවසඤ්ඤානාසඤ්ඤායතන කිරියචිත්තඤ්චෙ'ති ඉමානි චත්තාරි'පි අරූපාවචරකිරියචිත්තානි නාම.

29 ඉච්චෙවංසබ්බථාපි ද්වාදස අරූපාවචර කුසල විපාක කිරියචිත්තානි සමත්තානි.

30 ආරම්මණප්පභෙදෙන – චතුධා'රුප්පමානසං,
පුඤ්ඤපාකක්‍රියාභෙදා – පුන ද්වාදසධා ඨිතං

(සංක්‍ෂෙප ලොකොත්තර සිත් 8)

31 සොතාපත්තිමග්ගචිත්තං, සකදාගාමිමග්ගචිත්තං, අනාගාමි මග්ගචිත්තං, අරහත්ත මග්ගචිත්තඤ්චෙ'ති ඉමානි චත්තාරි'පි ලොකුත්තරකුසලචිත්තානි නාම.

32 සොතාපත්තිඵලචිත්තං, සකදාගාමිඵලචිත්තං, අනාගාමිඵලචිත්තං, අරහත්තඵලචිත්තඤ්චෙ'ති ඉමානි චත්තාරි'පි ලොකුත්තරවිපාකචිත්තානි නාම.

33 ඉච්චෙවං සබ්බථාපි අට්ඨලොකුත්තරකුසලවිපාක චිත්තානි සමත්තානි.

34 චතුමග්ගප්පභෙදෙන–චතුධා කුසලං තථා,
පාකං තස්ස ඵලත්තා'ති–අට්ඨධා'නුත්තරංමතං

(ජාතිභෙදයෙන් ගිනීම)

35 ද්වාදසා'කුසලානෙ'වං–කුසලානෙ'ක වීසති,
ඡත්තිංසෙ'ව විපාකානි–ක්‍රියාචිත්තානි වීසති.

(භූමිභෙදයෙන් ගිනීම)

36 චතුපඤ්ඤාසධා කාමෙ–රූපෙ පණ්ණරසී'රයෙ,
චිත්තානි ද්වාදසා'රූපෙ–අට්ඨධා'නුත්තරෙ තථා.

27 ආකාසානඤ්චායතනවිපාකසිත ද විඤ්ඤාණඤ්චායතනවිපාකසිත ද ආකිඤ්චඤ්ඤායතනවිපාකසිත ද නෙවසඤ්ඤානාසඤ්ඤායතනවිපාකසිත ද යන මොහු සතරදෙන ද **අරූපාවචරවිපාකචිත්තයෝ** නම් වෙත්.

28 ආකාසානඤ්චායතනකිරියසිත ද විඤ්ඤාණඤ්චායතනකිරියසිත ද ආකිඤ්චඤ්ඤායතනකිරියසිත ද නෙවසඤ්ඤානාසඤ්ඤායතනකිරියසිත ද, යන මොහු සතරදෙනද **අරූපාවචරකිරියචිත්තයෝ** නම් වෙත්.

29 මෙසේ සර්වප්‍රකාරයෙන් දොළොසක්වූ අරූපාවචරකුසල විපාක කිරිය චිත්තයෝ සමාප්තයහ.

30 අරූපාවචරසිත ආරම්මණ භෙදයෙන් සිවුවැදෑරුම් වේ. නැවත කුසල විපාක කිරිය භෙදයෙන් දොළොස් ආකාරයකින් සිටියේය.

**සංක්ෂෙපලෝකෝත්තර සිත් 8**

31 සෝතාපත්ති මග්ගචිත්තය ද සකදාගාමි මග්ගචිත්තය ද අනාගාමි මග්ගචිත්තය ද අරහත්තමග්ගචිත්තය ද යන මොහු සතරදෙන ද **ලෝකෝත්තරකුසලචිත්තයෝ** නම් වෙත්.

32 සෝතාපත්තිඵල චිත්තය ද සකදාගාමිඵල චිත්තය ද අනාගාමිඵල චිත්තය ද අරහත්තඵල චිත්තය ද යන මොහු සතරදෙන ද **ලෝකෝත්තරවිපාක චිත්තයෝ** නම් වෙත්.

33 මෙසේ සර්වප්‍රකාරයෙන් ලොකොත්තර කුසල විපාක චිත්තයෝ සමාප්තයහ.

34 සෝතාපත්තිමාර්ගීය ආදී මාර්ගසතරගේ භෙදයෙන් ලෝකෝත්තර කුසලචිත්තය චතුර්විධ වේ. විපාකය වනාහි ඒ කුසලයාගේ ම ඵලය බැවින් සතරආකාර වේ. මෙසේ ලෝකෝත්තරචිත්තය අටවැදෑරුම් යයි දත්තාලදී.

**ජාතිභෙදයෙන් ගිනීම**

35 අකුසල්සිත් දොළස 12 ය කුසල්සිත් එක්විස්ස 21 ය විපාකසිත් සතිස 36 ය කිරියසිත් විස්ස 20 යයි මෙසේ ජාතිභෙදයෙන් චිත්තය එකුන්අනූව 89 ක් වේ.

**භූමිභෙදයෙන් ගිනීම**

36 කාමාවචරසිත් සූපණස 54 ය. රූපාවචරසිත් පසළොස 15 ය. අරූපාවචරසිත් දොළොස 12 ය. ලෝකෝත්තරසිත් අට 8 යයි මෙසේ භූමිභෙදයෙන් චිත්තය එකුන්අනූව 89 ක් වේ.

(නිගමනය)

37 ඉත්ථ'මෙකූනනවුති-ප්පභෙදං පන මානසං,
ඒකවීසසතං වා'ථ-විභජන්ති විචක්ඛණා.

(ලෝකෝත්තර චිත්තය 40 ක් වන සැටි)

38 කථ'මෙකූනනවුතිවිධං චිත්තං ඒකවීසසතං හොති? විතක්කවිචාර පීතිසුඛෙකග්ගතාසහිතං පඨමජ්ඣාන සොතාපත්ති මග්ගචිත්තං, විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන සොතාපත්තිමග්ගචිත්තං, පීතිසුඛෙකග්ගතාසහිතං තතියජ්ඣාන සොතාපත්තිමග්ගචිත්තං, සුඛෙකග්ගතාසහිතං චතුත්ථජ්ඣාන සොතාපත්තිමග්ගචිත්තං. උපෙක්ඛෙකග්ගතාසහිතං පඤ්චමජ්ඣානසොතාපත්තිමග්ගචිත්තඤ්චෙති ඉමානි පඤ්චපි සොතාපත්තිමග්ගචිත්තානි නාම.

39 තථා සකදාගාමිමග්ග, අනාගාමිමග්ග, අරහත්තමග්ගචිත්තඤ්ච'ති සමවීසතිමග්ගචිත්තානි. තථා ඵලචිත්තානි චෙති සමචත්තාළීස ලොකුත්තරචිත්තානි භව'න්තීති.

40 ඣානඞ්ග යොග භෙදෙන-කත්වෙ'කෙකන්තු පඤ්චධා,
වුච්චතා'නුත්තරං චිත්තං-චත්තාළීස විධං'තිච.

(ලෞකික ලෝකෝත්තර ධ්‍යානසිත් පිඬුකිරීම.)

41 යථා ච රූපාවචරං-ගය්හතා'නුත්තරං තථා,
පඨමාදිඣානභෙදෙ-ආරුප්පඤ්චා'පි පඤ්චමෙ.
ඒකාදසවිධං තස්මා-පඨමාදික'මීරිතං,
ඣාන'මෙකෙක'මන්තෙතු-තෙවීසතිවිධං භවෙ.

(කුසල් අකුසල් හා විපාක ක්‍රියා විස්තර වශයෙන්)

42 සත්තතිංස විධං පුඤ්ඤං-ද්විපඤ්ඤාසවිධං තථා,
පාක'මිච්චා'හු චිත්තානි-ඒකවීසසතං බුධා.

ඉති අභිධම්මත්ථසඞ්ගහෙ චිත්තසඞ්ගහ විභාගො නාම පඨමො පරිච්ඡෙදො.

### නිගමනය

37 චිත්තය වනාහි මෙසේ කියනලද ප්‍රභෙදයෙන් එකූන් අනූව 89 ක් වන්නේය. ප්‍රාඥයෝ එය එකසිය එක්විස්ස 121 ක් කොට බෙදත්.

### ලෝකෝත්තරචිත්තය හතළිස 40 ක් වන සැටි.

38 එකූන් අනූ ප්‍රභෙද ඇති චිත්තය එකසිය විසි එකක් වන්නේ කෙසේදයත්? විතක්කවිචාරපීතිසුඛ එකග්ගතා සහිත පඨමජ්ඣාන සෝතාපත්තිමග්ග චිත්තය ද, විචාර පීති සුඛ එකග්ගතාසහිත දුතියජ්ඣාන සෝතාපත්තිමග්ග චිත්තයද' පීතිසුඛ එකග්ගතා සහිත තතියජ්ඣාන සෝතාපත්තිමග්ග චිත්තය ද, සුඛඑකග්ගතා සහිත චතුත්ථජ්ඣාන සෝතාපත්ති මග්ග චිත්තය ද, උපෙක්ඛා එකග්ගතා සහිත පඤ්චමජ්ඣාන සෝතාපත්ති මග්ග චිත්තය ද යි යන මොහු පස්දෙන ද සෝතාපත්ති මග්ගචිත්තයෝ නම් වෙත්.

39 එසේ ම සකදාගාමිමග්ග චිත්තය ද අනාගාමි මග්ගචිත්තය ද, අරහත්තමග්ග චිත්තය ද පහක් පහක් වීමෙන් මාර්ගී සිත් සම විස්සක්වේ. එසේම ඵලසිත් ද සමවිස්සක් වේ. මෙසේ ලෝකෝත්තර චිත්තයෝ සම සතළිසෙක් වෙත්.

40 එක් එක් ලෝකෝත්තරචිත්තය ධ්‍යානාඞ්ගයෝග භෙදයෙන් පස් පස් වැදෑරුම් කොට ලෝකෝත්තර චිත්තය සතළිස් වැදෑරුම් වන්නේ යයි ද කියනු ලැබේ.

### ලෞකික ලෝකෝත්තර ධ්‍යානසිත් පිඩුකිරීම.

41 රූපාවචර චිත්තය ප්‍රථමධ්‍යානාදි භෙදයෙහි ලා යම්සේ ගනු ලැබේ ද එසේම ලොකොත්තර චිත්තය ද එම ධ්‍යාන භෙදයෙහි ලා ගනු ලැබේ. අරූපාවචර චිත්තය ද පඤ්චමධ්‍යානයෙහි ලා ගනු ලැබේ. එහෙයින් ප්‍රථමධ්‍යානාදි එක් එක් ධ්‍යානයක් හා යෙදෙන චිත්තයෝ එකොළොස් එකොළොස් වැදෑරුම් වේ. අන්තිම වූ පඤ්චමධ්‍යානය හා යෙදෙන චිත්තය වනාහි තෙවිසි වැදෑරුම් වේ.

### කුසල් අකුසල් හා විපාක ක්‍රියා විස්තර වශයෙන්.

42 කුසල්සිත් සත්තිසෙ 37 ක් වේ. එසේ ම විපාක සිත් දෙපණසෙ 52 ක් වේ. මෙසේ අකුසල් සිත් දෙළ 12 ස හා ක්‍රියා සිත් විස් 20 සත් සමග ප්‍රාඥයෝ සිත් 121 ක් යයි කීහු.

මෙසේ අභිධර්මාර්ථ සංග්‍රහයෙහි චිත්තසඞ්ගහවිභාග නම්වූ

**ප්‍රථම පරිච්ඡේදය නිමි.**

# නිවේදනයයි.

---

අභිධර්මය ප්‍රථම භාගයෙහි ඉගැන්විය යුත්තේ පහත සඳහන් දේ හැර ඉතිරි කොටස් පමණක් බව නිවේදනය කරමි.

එනම් :—

1. [ ] මේ වරහන් වලින් වෙන්කළ කොටස්ද,

2. 6, 13 වැනි පාඩම් දෙකද,

3. 19 වැනි පිටුවේ 8 වැනි පේලියේ පටන් 21 වැනි පිටුවද,

4. 66 සහ 69 වැනි පිටුවේ විස්තර ලෝ-කෝත්තර සිත් 40 යන කොටසේ සිට 70 වෙනි පිටුව ද,

5. 1 පටන් 11 දක්වා අංක යෙදූ සවරූප විභාග කොටුද වේ.

Scanned with CamScanner

# අභිධර්මය.

## ප්‍රථමභාගය

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

**1 වැනි පාඩම.**

## අභිධර්මය හැඳින්වීම.

බුදුරජාණන් වහන්සේ විසින් දෙශනා කරණලද ධර්මය බුද්ධවචනය නමි. බුද්ධධර්මය යි ද කියනු ලැබේ. ඒ බුද්ධවචනය පළමු කොට ධර්මය-විනය වශයෙන් කොටස් දෙකකට ද ඉක්බිති විනය-සූත්‍ර-අභිධර්ම වශයෙන් පිටක තුණකට ද බෙදේ. පළමු බෙදීමෙහි භික්ෂු භික්ෂුණීන්ගේ හික්මීම උදෙසා පනවනලද සියලු නීති රීති විනය නමින් ද, ඉතිරි සියලු දෙශනා ධර්ම නමින් ද හැඳින් වේ. දෙ වැනි බෙදීමේ දී ධර්මයම සූත්‍ර-අභිධර්ම නමින් දෙකොටසකට බෙදී, මෙසේ තුන්පිටකය සෑදී තිබේ. බුදුන් පිරිනිවී පසු මහරහතුන් කළ ධර්මසඞ්ගායනාවන්හි දී මේ බෙදීම් ඇති විය.

සූත්‍ර නාමයෙන් ලැබෙන්නේ ඒ ඒ තැන්හි දී නොයෙක් පුද්ගලයන්ට සුවසේ වැටහී යන අයුරු නොයෙක් හෙතු-උදාහරණ-උපමා ආදියෙන් ධර්මය පහදා දීමට ඔවුනොවුන් අමතා බුදුරජාණන් වහන්සේ ඉමහත් කරුණාවෙන් පැවැත්වූ ධර්මදෙශනාවෝ යි. මේ සියලු දෙශනාවන්හි සාරය ගෙණ ලෝකයෙහි වියතුන් අතර එතෙක් රැව්පිළිරැව් දුන් ධර්මතාවන් පිළිබඳ නොයෙක් ගැඹුරු ප්‍රශ්න සියල්ලම සම්පූර්ණයෙන්ම, මඳකුදු වෙනසක් නො වන සේ විසඳෙන අයුරු දෙශනා කරණලද විශෙෂ ධර්මය **අභිධර්ම** නාමයෙන් හඳුන්වනු ලැබේ. එනම්; ඉතා සියුම් වූ ධාතු=ස්වභාවධර්ම ශාස්ත්‍රය යි. මේ අභිධර්මයට **පරමාර්ථ දෙශනා** යනු ද නමකි. මෙය අඩංගු වන පොත් සතක් වෙති. "සප්තප්‍රකරණ" යන නමින් කියවෙන්නේ ඒ පොත් සතය.

එනම්:- **ධම්මසඞ්ගණි - විභඞ්ග - ධාතුකථා - පුග්ගල පඤ්ඤත්ති - කථාවත්ථු - යමක - පට්ඨාන** යන මොහු වෙති.

**මේ පොත් සතෙහි ම එන පරමාර්ථධර්මයෝ චිත්ත-චෛතසික-රූප-නිර්වාණය යි** කොටස් සතරකට ඇතුළත් වෙති. ලොව ඇතිතාක් සියලුම ගණිත් ඉලක්කම් දහයේ තුළ ඇතුළත් වන්නාක් මෙන් සියලු ම අභිධර්මාර්ථයෝ මේ සතරෙහි ම ඇතුළත් වෙති. මේ **සතර අභිධර්මාර්ථය මැන වින් ප්‍රගුණ කිරීමෙන් ගත්කල්හි මුළු අභිධර්මපිටකයෙහි ම මූලික ඉගෙනුම සම්පූර්ණ වේ.**

2 වැනි පාඩම.

## පරමාර්ථ ධර්ම 4.

---

**අභිධර්මය** හෙවත් අභිධර්මාර්ථයෝ වනාහි **චිත්තය, චෛතසිකය, රූපය, නිබ්බානය** යි පරමාර්ථ වශයෙන් = වෙනස් නො වන සවභාවයෙන් සතර වැදෑරුම් වේ.

**චිත්තය** සිත = අරමුණු සිතන හෙයින් **චිත්ත** නම් වේ. එනම්: අරමුණු සිතන හෙවත් දැනගන්නා සවභාව ය යි. "**ආරම්මණ විජානන ලක්ඛණං චිත්තං**" යනු හෙයින් **සිතේ ලක්ෂණය අරමුණු දැනගැනීමය. අරමුණු** නම්; ඇස, කණ ආදියට ගොදුරු වන රූප, ශබ්ද ආදිය යි. සිත අරමුණකින් වෙන්ව නූපදී.

**චෛතසික** සිතෙහි උපදින්නේ හෙවත් සිතෙහි යෙදෙන්නේ **චෛතසික** නමි. එනම්;- සිතෙහි නිතර උපදින—සිත හා එකට යෙදෙන ස්පර්ශ = හැපීමය වේදනා = විඳීමය ආදී නොයෙක් ආකාර වූ සවභාව ධර්මයෝය. ඔවුහු සවභාව ලක්ෂණ වශයෙන් පනස් දෙකක් 52 වෙති. මොවුහු සිත සමග උපදිත්, සිත සමග නැසෙත්, සිත ඇසුරු කරන වස්තුව ම ඇසුරු කෙරෙත්, සිතට හමු වූ රූප ශබ්දාදිය ම අරමුණුකොට

ගතිත්. උපමා වශයෙන් සලකතොත් සිත සූපයක = හොද්දක ජලය මෙනි. චෛතසික එහි යෙදුනු දුරු, මිරිස්, ලුණු, ඇඹුල් ආදී රසයන් මෙනි. සිත චෛතසික යෙන් වෙන්වද, චෛතසික සිතින් තොරවද නූපදී.

රූපය

මෙහි ශීත උෂ්ණ ආදියෙන් විකාරවන වෙනස්වන හෙයින් **රූප** නම් වේ. එනම්: පඨවිධාතු තද ගතිය ආපොධාතු බැඳීම්ගතිය ආදී සවභාව ලක්ෂණ විසිඅට 28 කි. රූපධර්මයෝ චිත්ත චෛතසිකයන් ට වඩා වැඩි වේලාවක් ජීවත්වන හෙයින් ශීත උෂ්ණ ආදී විරුද්ධ හේතූන් හා ගැටෙත්. එවිට ඔවුන්ගේ පෙර පැවති ආකාරය වෙනස්ව අමුතු ආකාරයකට මාරුවෙත්. විකාරවීම වෙනස්වීම නම් මෙයයි. රූපධර්මයෝ සමූහ සමූහ වශයෙන් එක් වී නොයෙක් සටහන් ඇති ද්‍රව්‍ය බවට පැමිණෙත්. විකාරය වෙනස්වීම ප්‍රකට ව පවත්නා බැවින් එහි ම රූපව්‍යවහාරය ලැබේ. චිත්ත චෛතසික යන්ගේ වෙනස් වීම රූපයෙහි මෙන් ප්‍රකට නොවේ. සටහන් සහිත ද්‍රව්‍ය භාවයක් එහි නො ලැබෙන හෙයිනි. රූපයට අරමුණු ගත නොහැකිය.

නිබ්බාන

**නිබ්බාන** (නි+වාන) යන මෙහි **'වාන'** යනු තෘෂ්ණාවයි. ලොකු කුඩා භවයන් එකට ගළපන අර්ථයෙන් තෘෂ්ණාව වාන නමි. **'නි'** යනු නික්මීමය. තෘෂ්ණාවෙන් නික්මුනාවූ හෙවත් තෘෂ්ණාවෙන් අරමුණු කළ නොහැකිවූ ශාන්ත භාවය වූ නිවන නිබ්බාන නමි. **"සන්තිලක්ඛණං නිබ්බානං"** යි කී හෙයින් කෙලෙස් හා දුක් සන්සිඳීම නිවනෙහි ලක්ෂණය යි. නිර්වාණ යනු ද මෙයම ය.

## 3 වැනි පාඩම.

## ප්‍රඥප්තිය හා පරමාර්ථය.

---

**ප්‍රඥප්තිය** යනු ලොකව්‍යවහාර කථාවයි. ලෝකයා විසින් ඒ ඒ දේවලට තබාගත් නාමයෝ යි. මීට ම සම්මුති යි ද කියනු ලැබේ. මිනිස්, දෙවි, බඹ, ඉර, හඳ යනාදිය

මෙති. මෙසේ ව්‍යවහාර පහසුව තකා ලෝකයා විසින් තබාගන්නා ලද නාමයෝ **සම්මුති** නම් වෙත්. මොවුහු ලෝකව්‍යවහාර වශයෙන් ඇති නමුත් පරමාර්ථ වශයෙන් නම් නැත්තාහ. අප කථාකිරීමේ පහසුව පිණිසත් යම් යම් දේ වෙන් කොට දැනගැනීම පිණිසත් මේ ප්‍රඥප්තීන් යොදගත් බව සැලකිය යුතුය. ලෞකික වශයෙන් එහි ද සත්‍යයක් නැත්තේ නොවේ. එහෙයින් එය සම්මුති සත්‍යය යි හඳුන්වනු ලැබේ.

**පරමාර්ථය** නම් තම තමන් අයත් ගතියෙන් වෙනස් නො වන සවභාවය. චිත්ත, චෛතසික, රූප නිබ්බාන යන මොවුහු වෙනස් නො වෙති. එහෙයින් ඔවුහු පරමාර්ථ නම් වෙති. සිත වෙනස් වන්නාසේ පෙණෙතුදු එහි ලක්‍ෂණය වූ අරමුණු දැනීම නම් කිසිසේත් වෙනස් නො වේ. චෛතසික ආදීන්ගේ පරමාර්ථ භාවය ද මෙසේම දත යුතුය. පරමාර්ථය ඇත්ත වශයෙන් පවත්නා බැවින් පරමාර්ථසත්‍ය නමි. මේ පරමාර්ථසත්‍යයෙහි ඇතුළත් වන ධර්මයෝ නම් සිත් අසූනව 89 යි, චෛතසික පණස් දෙක 52 යි, රූප විසිඅට 28 හා නිබ්බානය යන මොහු වෙත්.

ප්‍රඥප්තිය නිතර වෙනස් වේ. **මිනිසෙකු** ගැන කල්පනා කරමු. ඔහු පිළිබඳ ළදරු, තරුණ, මහලු යන අවස්ථා තුනක් ලොකව්‍යවහාරයෙහි පැණෙති. එකම මිනිසා අවස්ථා වශයෙන් මේ ප්‍රඥප්ති=ව්‍යවහාරමාත්‍ර තුනම ලබයි. ඔහු මැරී ගොස් දෙව්ලොව ඉපිද දේවනාමය ලබයි. මිනිස් නම අත්හරී. ඉන් මැරී බඹ ලොව ඉපිද බ්‍රහ්මනාමය ලබයි. දෙවනාමය අත්හරී. මෙසේ වරින් වර කලින් කල වෙනස් වීම ප්‍රඥප්තියෙහි මිස පරමාර්ථයෙහි නැත. මනුෂ්‍යයාගේ ළදරු, තරුණ, මහලු අවස්ථාවලදී හෝ දිව්‍ය බ්‍රහ්ම අවස්ථාවලදී හෝ සිතෙහි වූ අරමුණු දැනගැනීම නමැති ලක්‍ෂණයාගේ වෙනසක් කිසිසේත් ඇති නොවේ. පරමාර්ථයක් හෙයිනි.

## 4 වැනි පාඩම.

# චිත්ත කාණ්ඩය.

---

සතර පරමාර්ථයන්ගෙන් **චිත්තපරමාර්ථය** කාමාවචරය, රූපාවචර ය, අරූපාවචරය, ලෝකෝත්තරය යි සිව් වැදෑරුම් වේ. කාමභූමිය, රූපභූමිය, අරූපභූමිය යන මේවා ස්ථාන වශයෙන් පවත්නා බැවින් **ස්ථාන භූමි** නම් වෙත්. ලෝකෝත්තර භූමිය වනාහි **අවස්ථා භූමියකි.** ලෝකෝත්තරභූමි නාමයෙන් ස්ථානයක් නැති බැවිනි. මෙහි "**භූමි**" යන්නෙන් ගෘහස්ථභූමිය, ශ්‍රමණභූමිය, සාමණේරභූමිය, උපසම්පන්නභූමිය යන ආදියෙහි මෙන් **අවස්ථාව** පමණක් ගණු ලැබේ. ලෝකෝත්තර මාර්ගඵල සිත් උපදින =පහළවන අවස්ථාමාත්‍රය ගෙන එම චිත්තයේ අවස්ථාභූමිය යි කියනු ලැබේ. නිබ්බානය = නිවන ද අවස්ථා භූමියකි.

**කාමාවචර සිත**

එකොළොස් වැදෑරුම් කාමභූමියෙහි බොහෝ සෙයින් හැසිරෙන පවතින = උපදින සිත **කාමාවචර** නම් වේ. එනම් :— කාමාවචරසිත් පණස් හතර 54 යි.

**රූපාවචර සිත**

හිත නැති අසඤ්ඤසත්වභූමිය හැර පසළොස් වැදෑරුම් රූපභූමියෙහි බොහෝ සෙයින් හැසිරෙන පවතින = උපදින සිත **රූපාවචර** නමි. එනම් :— රූපාවචර සිත් පසළොස 15 යි.

**අරූපාවචර සිත**

සතර වැදෑරුම් අරූපභූමියෙහි බොහෝ සෙයින් හැසිරෙන පවතින = උපදින සිත් **අරූපාවචර** නමි. එනම් :— අරූපාවචර සිත් දොළස 12 යි.

**ලෝකෝත්තර සිත**

**ලෝකෝත්තර** = ලෝක + උත්තර යන මෙහි **ලෝක** යනු තෘෂ්ණා දෘෂ්ටි දෙදෙනා විසින් අරමුණු වශයෙන් තදින් අල්වා ගන්නා ලද **උපාදානස්කන්ධ පසය.** එය කැඩී බිඳී විනාශ

වන බැවින් ලෝකතම් වේ. **උත්තර** යනු එතරවීමයි. ලෝකයෙන් එතර වෙමින් පවත්නා මාර්ග සිත්ද ලෝකයෙන් එතරවූ ඵලසිත්ද **ලෝකෝත්තර** නම් වේ. එනම්, ලෝකෝත්තර සිත් අට 8 ය. මේ සිත් අට ලෝකයෙහි ඇතුලත් නොවෙති.

**කාමාවචර සිත** වනාහි අකුසල් සිත් දොළස 12 ය අහේතුක සිත් දහඅට 18 ය, කාම සෝභනසිත් විසිහතර 24 යි පණස්හතරක් 54 වේ. එයින් අකුසල් සිත් දොළස ලෝභමූලසිත් 8 ය, ද්වේස මූලසිත් දෙක 2 ය. මෝහ මූල සිත් දෙක 2 යයි මූල භේදයෙන් කොටස් තුනක් වේ.

## 5 වැනි පාඩම

# ලෝභ මූලසිත් අට.

1 **සොම්නස්සහගත දිට්ඨිගත සම්පයුත්ත අසඞ්ඛාරිකහිත**

2 **සොම්නස්සහගත දිට්ඨිගත සම්පයුත්ත සසඞ්ඛාරිකහිත**

3 **සොම්නස්සහගත දිට්ඨිගත විප්පයුත්ත අසඞ්ඛාරිකහිත**

4 **සොම්නස්සහගත දිට්ඨිගත විප්පයුත්ත සසඞ්ඛාරිකහිත**

5 **උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසඞ්ඛාරිකහිත**

6 **උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත සසඞ්ඛාරිකහිත**

7 **උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසඞ්ඛාරිකහිත**

8 **උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසඞ්ඛාරිකහිත**

මේ සිත්අට ලෝභය සමග යෙදෙන බැවින් **ලෝභ සහගත** සිත් හීද, ගසකට මුලක්සේ ඒ ලෝභයම මේ සිත් අටට ද මුලක් වැනිවූ බැවින් **ලෝභමූලසිත්** හීද **ලෝභ**

සිත් හීද කියනුලැබේ. තවද ලෝභ ද්වේෂ ආදීන්ට මූල යන නාමයත් **හේතු** යන නාමයත් ව්‍යවහාර කරනු ලැබේ.

**සෝමනස්සසහගත** — මෙහි සොම්නස නම් ඉෂ්ට=ප්‍රිය අරමුණෙහි මිහිරි රසය කැමැත්තෙන් විඳිනා සැප **වේදනාවය**. ඒ සොම්නස හා යෙදුනේ **සෝමනස්සසහගත** නමි.

[**සිත සොම්නස් සහගතවීමට කරුණු සතරකි.**

ඒ නම් :- 1. සොම්නස් සිතකින් උපන්නෙකු වීමය.

2. නොගැඹුරු අදහස් ඇතිබවය.

3. ඉෂ්ට අරමුණු හා එක්වීමය.

4. ව්‍යසන විපත්ති වලින් මිදීමය.]

**දිට්ඨිගත සම්පයුත්ත** — දිට්ඨිගත සම්පයුත්ත යන මෙහි දිට්ඨි යනු දැක්මයි. ඒ දිට්ඨියද මිච්ඡාදිට්ඨිය, සම්මාදිට්ඨි ය යි දෙවැදෑරුම් වේ. එයින් මේ අකුසල අවස්ථාව බැවින් මෙහි මිච්ඡාදිට්ඨියම ගැණේ. ප්‍රාණඝාතය අදත්තාදානය යන ආදිය නිවැරදි යි යන ආදී වැරදි දැක්ම හෙවත් වැරදි හැඟීම **මිච්ඡා දිට්ඨිය යි**. දිට්ඨියම **දිට්ඨිගත** නමි. දෙසැට මිථ්‍යාදෘෂ්ටි යෙහි ඇතුලත් ය යන අර්ථයෙන් ද දිට්ඨිගත නමි. මිථ්‍යා දෘෂ්ටිය හා එක්ව මිශ්‍රවූයේ **දිට්ඨිගතසම්පයුත්ත** නමි.

**දිට්ඨිගත විප්පයුත්ත** — මිථ්‍යාදෘෂ්ටිය හා එක්ව නොයෙදුනේ **දිට්ඨිගතවිප්පයුත්ත** නමි.

[ සිත දිට්ඨිගත සම්පයුත්ත වීමට කරුණු පහ 5 කි.

එනම් :— 1. සතුන් මැරීම් ආදිය වරද නැත යන ආදී මිථ්‍යාදෘෂ්ටි අදහස් ඇති බවය.

2. මිථ්‍යාදෘෂ්ටිය ඇත්තවුන් ඇසුරුකිරීමය.

3. සද්ධර්මයෙන් වෙන්ව සිටීමය.

4. වැරදි කල්පනා බහුලකොට ඇති බවය.

5. නුනුවණින් මෙනෙහි කිරීමය.

දිට්ඨිගතවිප්පයුත්ත අකුසල් සිතට ද මේ කරුණුම වෙනස්කොට ගත යුතුයි. ]

උපෙක්ඛා සහගත

**උපෙක්ඛා** නම් මධ්‍යස්ථ අරමුණේ මිහිරිද අමිහිරද නොවූ රසය කැමැත්තෙනුත් අකමැත්තෙනුත් තොරව විඳගන්නා **වේදනාවය.** ඒ උපෙක්ඛාව හා එක්ව යෙදුනේ **උපෙක්ඛා සහගත** නම්.

[ සිතඋපෙක්ෂා සහගතවීමට කරුණු සතරකි.

එනම් :— 1. උපෙක්ෂා සිතකින් උපන්නෙකු වීමය.

2. ගැඹුරු අදහස් ඇති බවය.

3. මධ්‍යස්ථ අරමුණක් හා එක්වීමය

4. ඥාතිව්‍යසන ආදියෙන් මිදීමය.]

අසංඛාරික සසංඛාරික

යමක් කිරීමේදී මෙහෙයීමක් හෙවත් උනන්දු කර වීමක් නැතුව ස්වභාවයෙන් තියුණුව ඉබේමවගේ හටගන්නා සිත **අසඞ්ඛාරික** නම්. මෙහෙයීමක් හෙවත් උනන්දු කරවීමක් ඇතිව නොතියුණුව හටගන්නා සිත **සසඞ්ඛාරික** නම්.

Scanned with CamScanner

මෙහෙයීම ද අනුන්ගේ මෙහෙයීමය තමන්ගේම මෙහෙයීමය" යි දෙවිධියකින් ඇතිවන්නේය. අනුන්ගේ මෙහෙයීම නම් යම්කිසි දෙයක් කිරීමෙහි උනන්දු නො වී සිටින කල්හි එය "කරව" යි අනුන් විසින් උනන්දු කරවීමය. තමන්ගේ මෙහෙයීම නම් යම් දෙයක් කිරීමෙහි උනන්දු නොවී සිටින කල්හි එය කිරීමෙන් ඇතිවන ප්‍රයෝජනය හා නොකර සිටීමෙන් ඇතිවන පාඩුවද යන ආදිය සලකා පසුව තමන්ම උනන්දුවීමයි.

[සිත අසඞ්ඛාරික වීමට කරුණු සයකි.

එනම්:- 1. අසඞ්ඛාරික කර්මයකින් උපන්නෙකු වීමය.

2. කය හා සිත සැපවත් වීමයි.

3. ක්ෂාන්තිය ඉවසීම බහුලව ඇති බවය.

4. කායික්ශුර භාවයෙහි අගය දැනගැනීමය.

5. කටයුත්තෙහි මනා පුරුද්ද ඇති බවය.

6. සෘතු භොජනාදිය සුදුසු පරිදි ලැබීමය.

මෙකී කරුණු සය නො ලැබීමෙන් චිත්තය සසඞ්ඛාරික වන්නේය.]

---

6 වැනි පාඩම.

## ලෝභමූලසිත් අට උපදින ආකාරය

[1. යමෙක් තමන්ට ඉෂ්ට = ප්‍රිය අරමුණක් ලැබීම නිසා **සොම්නස්සහගතව** සොරකම, කාමමිථ්‍යාචාරය, යන ආදිය කිරීම වරද නැතැයි මිථ්‍යා අදහස් නිසා **දිට්ඨිගතසම්පයුත්තව** මෙහෙයීමක් නැතුව ඉබේමවගේ උපදනා තියුණුවූ අසංඛාරික සිතින් සොරකම, කාම මිථ්‍යාචාරය, බොරුකීම, කේලාම් කීම, ප්‍රලාපවචන

කීම, අන්සතු දේට ආශාකිරීම, මිථ්‍යාදෘෂ්ටි අදහස් ඇති කර ගැනීම යන මේ අකුසල් සතෙන් යම්කිසි අකුසල යක් කරයි ද එකල ඔහුට පළමුවැනි ලෝභ සිත උපදී.

2. යමෙක් ඉෂ්ට අරමුණක් ලැබීම නිසා **සොම්නස් සහගත** ව සොරකම් ආදී පව් කිරීම නිවැරදිය යන මිථ්‍යාදෘෂ්ටි අදහස් නිසා **දිට්ඨිගතසම්පයුත්තව** මෙහෙ යීමක් ඇති ව මොටවූ **සසඞ්ඛාරික** සිතින් සොරකම් ආදී අකුසල් සතෙන් යම්කිසි අකුසලයක් කරයි ද එකල ඔහුට දෙවන ලෝභ සිත උපදී.

3. යමෙක් ඉෂ්ට අරමුණක් ලැබීම නිසා **සොම්නස් සහගත** ව මිථ්‍යාදෘෂ්ටි අදහස් නැති නිසා **දිට්ඨිගත විප්පයුත්තව** මෙහෙයීමක් නැතිව ඉබේමවගේ උපදනා තියුණුවූ **අසඞ්ඛාරික** සිතින් සොරකම් ආදී අකුසල් සයෙන් යම්කිසි අකුසලයක් කරයි ද ඔහුට තුන්වන ලෝභසිත උපදී.

4. යමෙක් ඉෂ්ට අරමුණක් ලැබීම නිසා **සොම්නස් සහගතව** මිථ්‍යාදෘෂ්ටි අදහස් නැති නිසා **දිට්ඨිගතවිප්ප යුත්තව** මෙහෙයීමක් ඇතිව මොටවූ **සසඞ්ඛාරික** සිතින් සොරකම් ආදී අකුසල් සයෙන් යම්කිසි අකුසලයක් කරයිද එකල ඔහුට සතරවැනි ලෝභසිත උපදී.

5. යමෙක් ප්‍රියද නොවූ අප්‍රියද නොවූ මධ්‍යස්ථ අරමුණක් ලැබීම නිසා **උපෙක්ඛාසහගතව** සොරකම් ආදී පව්කිරීම නිවැරදිය යන මිථ්‍යාදෘෂ්ටි අදහස් නිසා **දිට්ඨිගත සම්පයුත්ත** ව මෙහෙයීමක් නැතිව ඉබේමවගේ උපදනා තියුණුවූ **අසඞ්ඛාරික** සිතින් සොරකම් ආදී අකුසල් සතෙන් යම්කිසි අකුසලයක් කරයි ද එකල ඔහුට පස්වැනි ලෝභසිත උපදී.

6. යමෙක් මධ්‍යස්ථ අරමුණක් ලැබීම නිසා **උපෙක්ඛා සහගතව** මිථ්‍යාදෘෂ්ටි අදහස් නිසා **දිට්ඨිගතසම්පයුත්තව** මෙහෙයීමක් ඇතිව මොටවූ **සසඞ්ඛාරික** සිතින් සොරකම් ආදී අකුසල් සතෙන් යම්කිසි අකුසලයක් කරයි ද එකල ඔහුට සවැනි ලෝභසිත උපදී.

Scanned with CamScanner

7. යමෙක් මධ්‍යසථ අරමුණක් ලැබීම නිසා **උපෙක්ඛා සහගතව** මිථ්‍යාදෘෂ්ටි අදහස් නැති නිසා **දිට්ඨිගතවිප්පයුත්තව** මෙහෙයීමක් නැතිව ඉබේම වගේ උපදනා තියුණුවූ **අසඞ්ඛාරික** සිතින් හොරකම් ආදී අකුසල සයෙන් යම් අකුසලයක් කරයි ද එකල ඔහුට සත්වැනි ලෝභසිත උපදී.

8. යමෙක් මධ්‍යසථ අරමුණක් ලැබීම නිසා **උපෙක්ඛා සහගතව** මිථ්‍යාදෘෂ්ටි අදහස් නැති නිසා **දිට්ඨිගතවිප්පයුත්තව** මෙහෙයීමක් ඇතිව මොට වූ **සසඞ්ඛාරික** සිතින් හොරකම් ආදිය කරයිද එකල ඔහුට අටවැනි ලෝභසිත උපදී. ]

## 7 වැනි පාඩම.

# ද්වේෂමූල සිත් දෙක.

---

1. **දෝමනස්සසහගත පටිඝසම්පයුත්ත අසඞ්ඛාරික සිත.**
2. **දෝමනස්සසහගත පටිඝසම්පයුත්ත සසඞ්ඛාරික සිත.**

මේ සිත් දෙක ගසකට මුලක්සේ ද්වේෂය මුල්කොට ඇති බැවින් **ද්වේෂමූලසිත්** යී ද, **ද්වේෂසිත්** යී ද, **ද්වේෂ සිත්** යීද, ප්‍රතිඝය හා එක්ව උපදනා බැවින් **පටිඝසම්පයුත්ත සිත්** යී ද, **පටිඝසිත්** යී ද, දෝමනස් වේදනාව හා යෙදෙන බැවින් **දෝමනස්සසහගත සිත්** යී ද කියනු ලැබේ.

දෝමනස්සසහගත

මෙහි **දෝමනස්** නම් අනිෂ්ට අරමුණේ අමිහිරි රසය නොකැමැත්තෙන් විඳින **දුක් වේදනාවය.** ඒ දෝමනස හා යෙදුනේ **දෝමනස්සසහගත** නමි.

පටිඝ සම්පයුත්ත

අරමුණෙහි විරුද්ධාකාරයෙක් හැපෙමින් හිංසා=පීඩා කරන ස්වභාවය හෙවත් ක්‍රෝධය පටිඝ නමි. මේ ක්‍රෝධය හෙවත් තරහ හෘදය වස්තුව ඇසුරුකොට ඉපිද එහි හැපෙමින් එය ගිනිකබලක් සේ රත්කරයි. එහි වූ සිත ද උණුසුම් කොට දවයි. එවිට කය ද උණුසුම් වී දැවෙයි. ඒ කය අනුන් සමග හැපී ඔවුනට ද හිංසා පීඩා කරයි. මෙසේ තරහ ඇති තැනැත්තා ඒ තරහ නිසා අනුන්ට හිංසා කොට තමනුත් හිංසාවට පීඩාවට පැමිණෙන්නේ ය. එහෙයින් මෙයට පටිඝ යි කියන ලදී. පටිඝය හා එක්ව යෙදුනේ **පටිඝසම්පයුත්ත** නමි.

අසඞ්ඛාරික හා සසඞ්ඛාරික බව පෙරකී පරිද්දෙන් දත යුතුයි.

[ සිත දොම්නස් වීමට හා පටිඝ සම්පයුත්තවීමට හේතු හතරකි.

එනම්:— 1. තරහ ගති ඇති බව=කිපෙන සුළුබව ය.

2. යමක දුරදිග නො පෙණෙන බවයි.

3. නූගත් බවය.

4. අමනාපදෙය හා එක්වීම යි. ]

## ද්වේෂමූල දෙසිත උපදින ආකාරය.

[ 1. යමෙක් අනිෂ්ට=තමන් නොකැමැති අරමුණක් ලැබී සිත දුක්වීමෙන් **දොම්නස්සහගතව** සැඩගති ඇති වීමෙන් **පටිඝසම්පයුත්තව** මෙහෙයීමක් නැතිව ඉබේම වගේ උපදනා තියුණුවූ **අසඞ්ඛාරික** සිතින් සතුන් මැරීම, හොරකම් කිරීම, බොරුකීම, කේළාම්කීම, පරුෂවචන කීම, නිෂ්ඵල වචනකීම, ව්‍යාපාදය යන අකුසල සිතින් යම්කිසි අකුසලයක් කරයි ද එකල ඔහුට පළමුවන ද්වේෂසිත උපදී. ]

2. යමෙක් අනිෂ්ට අරමුණක් ලැබී සිත දුක්වීමෙන් **දොම්නස්සහගතව** සැඬගති ඇතිවීමෙන් **පටිඝසම්පයුත්තව** මෙහෙයීමක් ඇතිව මොට වූ **සසඞ්ඛාරික** සිතින් සතුන් මැරීම් ආදී අකුසල් සතෙන් යම්කිසි අකුසලයක් කරයි ද එකල ඔහුට දෙවැනි ද්වේෂසිත උපදී.]

## 8 වැනි පාඩම.

# මොහමූල සිත් දෙක.

---

1. **උපෙක්ඛාසහගත විචිකිච්ඡාසම්පයුත්ත සිත.**

2. **උපෙක්ඛාසහගත උද්ධච්චසම්පයුත්ත සිත.**

මේ සිත් දෙක ගසකට මුලක්සේ මෝහය මුල්කොට ඇති බැවින් **මෝහමූලසිත්** යී ද බලවත් මෝඩකමින් යුත් බැවින් **මෝමූහසිත්** යී ද මෝහය සමග යෙදෙන බැවින් **මෝහසහගතසිත්** යී ද මෝහසිත්යී ද කියනු ලැබේ. උපෙක්ඛාසහගත යන්න පෙර කී සේම දත යුතුයි.

**විචිකිච්ඡා සම්පයුත්ත සිත**

**විචිකිච්ඡා** නම් බුද්ධාදී අටතැනක උපදින සැකයි වේ. එය හා එක්ව යෙදුන සිත **විචිකිච්ඡාසම්පයුත්ත** සිතයි. විචිකිච්ඡාව මෝහමූල ප්‍රථම චිත්තයෙහිම යෙදේ. එහෙයින් මේ සිත හැඳින්වීම පිණිස "විචිකිච්ඡා සම්පයුත්තය" යි මෙයම වෙන්කොට කියන ලදී.

[ සිත විචිකිච්ඡාසම්පයුත්තවීමට හේතු සතකි.

එනම්:— 1. ධර්මය නූගත්බව, 2. ශ්‍රද්ධාව නැතිබව, 3. බුද්ධාදී උතුමන්ගැන නොවිචාරීම, 4. ශික්ෂාව නොදත්බව, 5. පාපමිත්‍රයන් ඇසුරුකිරීම, 6. නිතර රත්නත්‍රයට දෙස් නඟා කථාකිරීම, 7. අරමුණෙහි නියම තත්වය ඉක්මවා කල්පනාකිරීම යන මොහුය. ]

උද්ධච්ච සම්පයුක්ත සිත

**උද්ධච්ච** යනු සිතෙහි ඇතිවන නොසන්සුන් බවයි. හෙවත් කැළඹීම් සවභාවය යි. ඒ උද්ධච්චය හා එක්ව යෙදුන සිත **උද්ධච්ච සම්පයුත්ත** සිතයි. මේ උද්ධච්චය අකුසල් සිත් දොළසෙහි ම යෙදේ. එහෙත් මේ සිතෙහි ම එය බලවත් යි. අනික් සිත්හි දුර්වලය යන බව දැක්වීම පිණිස මෙය ම "උද්ධච්ච සම්පයුත්ත" යි කියන ලදී.

[ සිත උද්ධච්ච සම්පයුත්තවීමට හේතු සතකි.

එනම්:— 1. නූගත්බව, 2. හොඳ නොහොඳ දේ ගැන නිතර නො විචාරීම, 3. ශික්ෂාව නොදත්බව, 4. ගුණවෘද්ධයන් සේවනය නොකිරීම, 5. පාපමිත්‍රයන් ආශ්‍රය කිරීම, 6. නිතර නුසුදුසු දේ ගැන කථාකිරීම, 7. සිත කය දෙකට කරදර ඇතිබව යන මොහුය. ]

වේදනා සම්ප්‍රයෝගය

මේ මෝහමූල සිත් දෙක ලෝභාදී හේතූන් හා මිශ්‍ර නොවූ බලවත් මෝහය සමගම යෙදෙන බැවින් අතිශයින් මෝඩය. විචිකිච්ඡා, උද්ධච්චයන් හා යෙදෙන බැවින් චඤ්චලය. එහෙයින් මේ දෙසිත උපෙක්ෂාවේදනාව සමගම යෙදේ. **මෝහමූල දෙසිත** වනාහි සත්වයන්ට ප්‍රකෘති සවභාවයෙන් ම යම්කිසි උනන්දුකරවීමක් නොමැතිව ඉබේම වගේ උපදනේය. එහෙයින් **අසඞ්ඛාරික** යයි ද දතයුතුයි.

## මෝහමූල සිත් දෙක උපදින අයුරු.

[1. යමෙක් බලවත් මෝහයෙන් මෝඩවීමෙන් **උපෙක්ෂාසහගත ව** ධර්මය නුගත්කම ආදිය නිසා **විචිකිච්ඡාසම්පයුත්ත ව** ඉබේම වගේ උපදනා සිතින් බුඩාදී ගැඹුරු අරමුණෙහි සැක කරයි ද එකල ඔහුට පළමුවෙනි මෝහ සිත උපදී.

2. යමෙක් බලවත් මෝහයෙන් මෝඩවීමෙන් **උපෙක්ෂාසහගත ව** නොසන්සුන් වීමෙන්=කලබල වීමෙන් **උද්ධච්චසම්පයුත්ත ව** ඉබේම වගේ උපදනා සිතින් යම්කිසි අකුසලයක් කරයි ද එකල ඔහුට දෙවෙනි මෝහසිත උපදී.]

අකුසල් — **අකුසල්** නම් භයානක දුක්විපාක උපදවන සවභාවයෝය. ඔවුහු නිතරම කුසලයන්ට ප්‍රතිවිරුඩ වෙත්. මිත්‍රයාට අමිත්‍රයා මෙනි.

සවරූප බෙදීම — [අකුසල් සිත් දෙළොසෙහි සොම්නස්සහගත සිත් සතර 4 ය, දොම්නස්සහගත සිත් දෙක 2 ය, උපෙක්ෂාසහගත සිත් හය 6 ය මෙසේ වේදනා භෙදයෙන් බෙදිය යුතුය. සම්පයුත්ත සිත් අට 8 ය, විප්පයුත්ත සිත් සතර 4 ය, මෙසේ සම්පයුත්ත විප්පයුත්ත භෙදයෙන්ද, අසඞ්ඛාරික සිත් සත 7 ය, සසඞ්ඛාරික සිත් පස 5 ය යි අසඞ්ඛාරික—සසඞ්ඛාරික භෙදයෙන් ද බෙදිය යුතුය. සවරූප වින්‍යාසයෙහි එන පරිදි සොම්නස්සහගත ආදී හත් ආකාරයෙන් ම සිත් ගණන් කරමින් අහුලනු. "සම්පයුත්ත" යන වචනය ඇති සිත් සම්පයුත්තසිත් කොටසෙහි ද, ඒ වචනය නැති සිත් විප්පයුත්ත සිත් කොටසෙහි ද ලා අහුලනු.]

| 1 [ අකුසල් සිත් දොළොසෙහි ස්වරූප ප්‍රභෙද විත්‍යාසය. | | සොමනස්සසහගත සිත් | දොමනස්සසහගත සිත් | උපේක්ෂාසහගත සිත් | සම්ප්‍රයුක්ත සිත් | විප්‍රයුක්ත සිත් | අසංස්කාරික සිත් | සසංස්කාරික සිත් |
|---|---|---|---|---|---|---|---|---|
| ලෝභමූල සිත් | 8 | 4 | 0 | 4 | 4 | 4 | 4 | 4 |
| ද්වේෂමූල සිත් | 2 | 0 | 2 | 0 | 2 | 0 | 1 | 1 |
| මෝහමූල සිත් | 2 | 0 | 0 | 2 | 2 | 0 | 2 | 0 |
| අකුසල් සිත් | 12 | 4 | 2 | 6 | 8 | 4 | 7 | 5 |

අකුසල් සිත් 12 හ නිමි. ]

### 9 වැනි පාඩම.

## අහේතුක සිත් (18)

---

අකුසල විපාක සිත් සතය, අහේතුක කුසල විපාක සිත් අටය, අහේතුකකිරිය සිත් තුණ ය යි අහේතුක සිත් දහ අටකි. සිත් උපදවන අන්‍ය හේතුන් ඇතත් ලෝභ, ද්වේෂ, මෝහ, අලෝභ, අද්වේස, අමෝහ යන සම්පයුත්ත =එක්ව යෙදෙන හේතුන් හා එක්ව නොයෙදෙන බැවින් මොවුහු අහේතුක නම් වෙත්. මෙයින් අන්‍ය සිත් සියල්ලම සහේතුක නම් වෙත්.

## අකුසලවිපාකසිත් සත.

1. උපෙක්ඛාසහගත චක්ඛුවිඤ්ඤාණය.
2. උපෙක්ඛාසහගත සෝතවිඤ්ඤාණය.
3. උපෙක්ඛාසහගත ඝාණවිඤ්ඤාණය.
4. උපෙක්ඛාසහගත ජිව්හාවිඤ්ඤාණය.
5. දුක්ඛසහගත කායවිඤ්ඤාණය.
6. උපෙක්ඛාසහගත සම්පටිච්ඡන සිත.
7. උපෙක්ඛාසහගත සන්තීරණසිත.

මේ සිත් සත දොළොස් අකුසලයන්ගේ විපාකයෝය. එහෙයින් අකුසල විපාක නම් වෙත්. අකුසල විපාකයෝ ඒකාන්තයෙන් අහේතුක වෙත්. සහේතුක අකුසල විපාක නැත.

## අහේතුක කුසලවිපාකසිත් අට.

1. උපෙක්ඛාසහගත චක්ඛුවිඤ්ඤාණය.
2. උපෙක්ඛාසහගත සෝතවිඤ්ඤාණය.
3. උපෙක්ඛාසහගත ඝාණවිඤ්ඤාණය.
4. උපෙක්ඛා සහගත ජිව්හාවිඤ්ඤාණය.
5. සුඛසහගත කායවිඤ්ඤාණය.
6. උපෙක්ඛාසහගත සම්පටිච්ඡනසිත.
7. සෝමනස්සසහගත සන්තීරණසිත.
8. උපෙක්ඛාසහගත සන්තීරණසිත.

මේ සිත් අට කාමාවචරකුසලයන්ගේ=දුර්වල විපාකයෝය. එහෙයින් අහේතුකකුසල විපාක නම් වේ. මතු දක්වෙන සහේතුක කුසල විපාකයන්ගෙන් වෙනස් කර ගනු පිණිස මේවා අහේතුක ය යි කියනු ලැබේ.

**චක්ඛුවිඤ්ඤාණය**

[ මෙහි **චක්ඛු** නම් චක්ෂුඃප්‍රසාද රූපය යි. එනම්, ඇස්ගෙඩියෙහි වූ මහාභූතරූපයන්ගේ සියුම් ඔපය යි. එහි ඔපය ඇති බැවින් ම කැඩපතෙක=කණ්ණාඩියක මෙන් රූප සෙව

නැලි පෙණේ. ලෝකයා ඇසය යි කියන්නේ බැම ඇටයෙන් වටවූ මස්ගඩුවටිය. ඒ මස්ගඩුවෙහි වූ මේ චක්ෂුඃ ප්‍රසාදය ම නියම පරමාර්ථ ඇසය යි දතයුතුය. එය චක්ඛුවිඤ්ඤාණය හටගන්නා ස්ථානය යි. ඇසෙහි රූප සෙවනැලි වැදගැනීම මුත් පෙනීමේ ශක්තියක් නැත. පෙනීමේ ශක්තිය එහි උපදනා විඤ්ඤාණයට අයත්ය. **විඤ්ඤාණ** යනු සිතට නමකි. ඇසෙහි උපදනා සිත **චක්ඛුවිඤ්ඤාණය** යි. මේ සිත ඇසට හමුවන වර්ණය වූ රූපය ගොදුරුකොටගෙණ එයම දකිමින් උපදී. චක්ඛු විඤ්ඤාණය උපදවන හේතු සතරකි. එනම්:—

1. චක්ඛුපසාදය, 2. රූපාරම්මණය, 3. ආලෝකය, 4. මනසිකාරය යන මොහුය. ]

**සෝතවිඤ්ඤාණය**

[**සෝත** නම් ශ්‍රෝත්‍රප්‍රසාද රූපය යි. එනම්, කන්සිදුර තුළ සිහින් තඹපාට රෝම වලින් කුඩා මුදුවක්සේ සෑදුනු මහාභූතයන්ගේ පැහැදිලි බව ය. නියම කණ නම් එයම වේ. එය සෝතවිඤ්ඤාණය හටගන්නා ස්ථානය යි. එහි ශබ්දයන් වැදගැනීම මුත් ඇසීමේ ශක්තියක් නැත. ඒ ශක්තිය එහි හටගන්නා විඤ්ඤාණයට අයත්ය. කණෙහි උපදනා සිත **සොතවිඤ්ඤාණයයි**. මේ සිත කණට ශබ්දය ඇසෙන කල්හි උපදී. සෝතවිඤ්ඤාණය උපදවන හේතු සතරකි. එනම් :—

1. ශ්‍රෝත්‍රප්‍රසාදය, 2. ශබ්දාරම්මණය, 3. ආකාශය, 4. මනසිකාරය යන මොහුය. ]

**ඝාණවිඤ්ඤාණය**

[ **ඝාණ** නම් ඝ්‍රාණප්‍රසාද රූපයයි. එනම්, නැහැය තුළ එළුකුරයක්සේ සෑදුනු මහාභූතයන් කෙරෙහි පැතිරීගිය පැහැදිලි බවය. නියම නාසය නම් එය ම වේ. එය ඝාණවිඤ්ඤාණය හටගන්නා ස්ථානය යි. එහි ගඳ හෝ සුවඳ වැදගැනීම මුත් ආඝ්‍රාණය කිරීමේ=ගඳ සුවඳ දැනගැනීමේ ශක්ති

යක් නැත. ඒ ශක්තිය එහි හටගන්නා විඤ්ඤාණයට අයත්ය. නාසයෙහි උපදනා සිත **ඝාණවිඤ්ඤාණය යි.** මේ සිත නාසයට ගඳ හෝ සුවඳ දැනෙන කල්හි උපදී. ඝාණවිඤ්ඤාණය උපදවන හේතු සතරකි. එනම් :—

1. ඝ්‍රාණප්‍රසාදරූපය, 2. ගන්ධාරම්මණය, 3. වායෝ ධාතුව, 4. මනසිකාරය යන මොහුය. ]

**ජිව්හාවිඤ්ඤාණය**

[ **ජිව්හා** නම් ජිව්හා ප්‍රසාදරූපය යි. එනම්, දිව ඉහල මැද පෙදෙසෙහි මානෙල් මල් පෙත්තක අග කොටසක හැඩහුරු කම ඇති තැනවූ මහා භූතයන්ගේ පැහැදිලිබවයි. නියම දිව නම් එයයි. මෙය ජිව්හාවිඤ්ඤාණය හටගන්නා ස්ථාන ය යි. එහි රසය වැදගැනීම මුත් රසය විඳගැනීමේ ශක්තියක් නැත. රස විඳීමේ ශක්තිය එහි හටගන්නා වේදනා සහිත සිතට අයත්ය. දිවෙහි උපදනා සිත **ජිව්හාවිඤ්ඤාණය යි.** මේ සිත දිවට රසයක් දැනෙන කල්හි උපදී. ජිව්හාවිඤ්ඤාණය උපදවන හේතු හතරකි. එනම් :—

1. ජිව්හාප්‍රසාදරූපය, 2. රසාරම්මණය, 3. ආපෝ ධාතුව, 4. මනසිකාරය යන මොහුය. ]

**කායවිඤ්ඤාණය**

[ **කය** වනාහි ප්‍රසාදකය ය මහාභූතකය යි දෙයාකාර වේ. එයින් මෙහි **කාය** නම් **ප්‍රසාදකය යි.** කිරෙහි මිශ්‍රවූ වතුර මෙන් මේ ශරීරයෙහි මහාභූතයන් කෙරෙහි† හැමතැන ම පැතිරී ගිය පැහැදිලි බව යි. එය කායවිඤ්ඤාණය හට ගන්නා ස්ථානය යි. එහි ස්පර්ශය වැදගැනීම මුත් විඳ ගැනීමේ ශක්තියක් නැත. ඒ ශක්තිය සුඛ, දුක්ඛ, වේදනා සහිත වූ සිතට අයත්ය. ප්‍රසාදකයෙහි උපදනා සිත

---

† බඩගිත්ත පිහිටි තැන, මසින් පිටවූ කෙස් අග, ලොම් අග, නිය අග, වියලි සම් ආදි තත්හි කායප්‍රසාදය නැත.

කායවිඤ්ඤාණය යි. මේ සිත කයෙහි ගැටුනු ස්පර්ශය දැනෙන කල්හි උපදී. කායවිඤ්ඤාණය උපදවන හේතු සතරකි. එනම්:—

1. කායප්‍රසාදය, 2. පොට්ඨබ්බ අරමුණ, 3. කායප්‍රසාදය සමග පවත්නා පඨවිධාතුව, 4. මනසිකාරය යන මොහුයි. ]

චක්ඛු, සොත යන ආදීහු එහි උපදනා චිත්ත චෛතසිකයන්ගේ වාසස්ථාන වන බැවින් චක්ඛුවත්‍ථු, සෝතවත්‍ථු යන ආදී වත්‍ථුනාමයෙන් ද, ගෙවලට ඇතුල්වන පිටවන දෙරටුමෙන් රූප අරමුණු ආදියට ඇතුල්වන පිටවන දෙරටු වැනිවූ බැවින් චක්ඛුද්වාර, සෝතද්වාර යන ආදී ද්වාර නාමයෙන් ද ව්‍යවහාර කරනු ලැබෙත්.

## 10 වැනි පාඩම

## දෙපස්විඤ්ඤාණය.

දෙපස් විඤ්ඤාණය හා එහි යෙදෙන වේදනා

චක්ඛුවිඤ්ඤාණය, සෝතවිඤ්ඤාණය, ඝ්‍රාණවිඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කායවිඤ්ඤාණය යන මේ සිත් පහ පඤ්චවිඤ්ඤාණ නමි. කුසලවිපාක පඤ්චවිඤ්ඤාණයත් අකුසලවිපාක පඤ්චවිඤ්ඤාණයත් එක් කොට මේ සිත් දහයටම **දෙපස්විඤ්ඤාණය** යි කියනු ලැබේ.

[දෙපස්විඤ්ඤාණයන් අතුරෙන් කායවිඤ්ඤාණ දෙක හැර සෙසු අටදෙන උපෙක්ඛා වේදනාව සමගම යෙදෙති. කෙසේදයත්? ඇස, කණ, නැහැය, දිව යන ප්‍රසාද රූපද එහි හැපෙන රූප, ශබ්ද, ගන්ධ, රස යන අරමුණු රූපද උපාදා රූපයෝය. උපාදාරූප යනු මහා භූතයන් නිසා පවත්නා රූපයෝය. පුළුන් රොදක් පුළුන්

රොදක හැපීම මෙන් උපාදාරූපයන්ගේ ගැටීම ඉතා දුර්වලය. එසේම දුර්වලවූ ඇස ආදී වස්තු සතරෙහි උපදනා චක්ඛුවිඤ්ඤාණාදිය ද දුර්වල වෙති. එහෙයින් ඒ සිත්හි වූ වේදනාව අරමුණු රසය මධ්‍යස්ථව අනුභව කරයි. විඳී. මේ නිසා ඉෂ්ට අරමුණෙහි සහ අනිෂ්ට අරමුණෙහි චක්ඛුවිඤ්ඤාණාදිය උපෙක්ඛා වේදනාව සමගම යෙදෙති. කායවිඤ්ඤාණයෝ එසේ නොවෙති. කායවිඤ්ඤාණ දෙකින් එකක් සුඛවේදනාව සමගද අනික දුක්ඛ වේදනාව සමගද යෙදේ. කාය විඤ්ඤාණය ඇසුරු කරන කාය ප්‍රසාදය උපාදාරූපයකි. මෙය මහාභූත කය ඇසුරු කොට පවතී. එහි ගැටෙන ඵොට්ඨබ්බ අරමුණ ද මහාභූත ත්‍රයයකි. පුළුන් රොදක් කිණිහිරක් උඩ තබා මිටියකින් ගැසූ කල මිටිය පුළුන් රොද විනිවිද ගොස් කිණිහිරේ හැපෙන්නාක්මෙන් ඵොට්ඨබ්බ අරමුණ ප්‍රසාදකයෙහි හැපී එය විනිවිද ගොස් එය ඇසුරුකළ මහා භූතකයෙහි ද වේගවත්ව හැපෙන්නේය. එවිට එය විඳීමට අපහසු නරක අරමුණක් වුව හොත් කයෙහි වූ මහාභූතයෝ පැසෙන උණු වතුරෙහි දැමූ මල්මෙන් තැවෙති. ඒ කයෙහි උපදනා විඤ්ඤාණය දුක්ඛවෙදනාව හා යෙදේ. විඳීමට පහසු හොඳ අරමුණක් වුවහොත් කයෙහි වූ මහා භූතයෝ සිසිල් වතුරෙහි දැමූ මල්මෙන් පුබුදු වෙත්. ඒ කයෙහි උපදනා විඤ්ඤාණය සුඛ වේදනාව හා යෙදේ.]

**සම්පටිච්ඡන දෙක**

අරමුණු මනාකොට පිළිගන්නා සිත **සම්පටිච්ඡන** නම්. යමෙකුගෙන් ලද වස්තුවක් එපාය යි ප්‍රතික්ෂේප නොකොට අතිකක් හෝ බලාපොරොත්තු නොව ලැබුණු අයුරින්ම පිළිගන්නාක් මෙන් පඤ්චවිඤ්ඤාණය විසින් ගත් අරමුණු පිළිගන්නා සිතය. මෙය අකුශල විපාක සම්පටිච්ඡනය කුශල විපාක සම්පටිච්ඡනය යි දෙයාකාර වේ. අනිෂ්ට අරමුණු පිළිගන්නේ **අකුසල විපාක සම්පටිච්ඡන සිතය.** ඉෂ්ට අරමුණු පිළිගන්නේ **කුසල විපාක සම්පටිච්ඡන සිතය.**

සන්තීරණ තුන

අරමුණු තීරණය කරනසිත **සන්තීරණ නම්.** එනම්, යම්දෙයක හොඳ නො හොඳ දැනගනු පිණිස විමසා තීරණය කරන්නාක් මෙන් සම්පටිච්ඡනචිත්තයෙන් පිළිගත් අර මුණු තීරණය කරණ සිතයි. සන්තීරණ සිත තුන්වැදෑරුම්. එනම් :—

අකුසල විපාක සන්තීරණ සිත් එකකි. කුසල විපාක සන්තීරණ සිත් දෙකකි. එයින් අනිෂ්ට අරමුණු තීරණය කරන්නේ **අකුසල විපාක සන්තීරණ සිතය.** කුසල විපාක සන්තීරණ සිත් දෙක අතුරෙන් අති ඉෂ්ට අරමුණු තීර ණය කරන්නේ **සොම්නස් සන්තීරණ සිතය.** ඉෂ්ට මධ්‍යස්ථ අරමුණු තීරණය කරන්නේ **උපෙක්ඛා සන්තීරණ සිතය.**

අහෙතුක පටිසන්ධි දෙක

[**අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිත** සතර අපායයෙහි උපදනා දුගති අහේතුකයන්ට ද, **කුසල විපාක උපෙක්ඛාසහගත සන්තීරණ සිත** කාම සුගතියෙහි උපදනා ජාත්‍යන්ධාදී හීන වූ සුගති අහෙතුක යන්ට ද පිළිසිඳීම් කෘත්‍යයෙන් උපදිත්.]

විපාක

මෙහි දැක්වූ අකුසල විපාක සිත් සත ඉහත සඳහන් දොළොස් අකුසල චිත්තයන්ගේ විපාකයෝය. අහේතුක කුසල විපාක සිත් අට මතු දැක්වෙන කාමාවචර කුසලයන්ගේ විපාකයන් ගෙන් සමහරකි. **විපාක** යනු කර්මයන්ගේ ලා අවස්ථාව ඉක්ම ගොස් **පැසීගිය අවස්ථාවය.**

[අඹ, දඹ ආදී ඵල වර්ග ගැන සිතා බලමු. අඹය ලා ගැට කාලය ඉක්මවා පැසීගිය කල්හි පැසුණු අඹය හෝ ඉදුනු අඹය යි කියනු ලැබේ. එසේම සත්වයන් විසින් රැස්කරන ලද කුසල අකුසලකර්මයෝ

ළා අවස්ථාව ඉක්මවා පැසීගිය කල්හි **විපාක** යන වෙන නමකින් උපදනාහුය. විපාකය වනාහි සත්ව යෙකුගේ උත්පත්තියෙහි දී පිළිසිඳීම් කෘත්‍යයෙන් හටගන්නා **ප්‍රතිසන්ධිවිපාකය** ද උපන් ශරීරය තුළ හට ගන්නා **ප්‍රවෘත්ති විපාකය** දැයි දෙවැදෑරුම් වේ. තමන් නොකැමැති රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයන් ඇස, කණ, දිව, නැහැය, කය යන මොවුන්ට හමුවන්නේ තමන් විසින් කරන ලද අකුසලකර්ම ඇති බැවිනි. ඊට ප්‍රවෘත්ති විපාක වශයෙන් උපදින්නේ අකුසල විපාක චක්ඛුවිඤ්ඤාණය ආදී අකුසල විපාක සිත් සතය. තමන් කැමති රූප ශබ්දාදිය ඇස්, කන් ආදියට හමුවන්නේ තමන් විසින් කරන ලද කුසලකර්ම ඇති බැවිනි, ඊට ප්‍රවෘත්ති විපාක වශයෙන් උපදින්නේ කුසලවිපාකචක්ඛුවිඤ්ඤාණය ආදී කුසලවිපාක සිත් අටය.]

## 11 වැනි පාඩම

## අහේතුක කිරිය සිත් තුන.

---

1. **උපෙක්ඛාසහගත පඤ්චද්වාරාවජ්ජන සිත**
2. **උපෙක්ඛාසහගත මනෝද්වාරාවජ්ජන සිත**
3. **සෝමනස්සසහගත හසිතුප්පාද සිත**

මේ සිත් තුන අහේතුක කිරියචිත්තයෝය. මතු දැක්වෙන සහේතුක කිරියචිත්තයන්ගෙන් වෙනස් කොට දැන ගැනීම පිණිස මෙහි **අහේතුක** යන වචනය යෙදෙන බව දතයුතුය.

පංචද්වාරා-
වජ්ජන සිත

**පඤ්චද්වාරාවජ්ජන** = පඤ්චද්වාර+ආවජ්ජන යන මෙහි චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය යන ද්වාර පස **පඤ්චද්වාර** නම්. **ආවජ්ජන** නම් මෙනෙහි කිරීමය. නොහොත් අරමුණට දෙර හැරීමය. පඤ්චද්වාරය අතුරෙන්

යම්කිසි ද්වාරයෙක්හි රූප අරමුණු ආදිය ගැටුණු කල්හි එය පළමුකොට මෙනෙහි කරන සිත **පඤ්චද්වාරාවජ්ජන සිතය.** නොහොත් දොරටුපාලයෙකු සේ අරමුණට හිතේ දොරටුපස ඇරීමය. අරමුණු මෙනෙහිකිරීම් මාත්‍රයෙන් යුත් බැවින් මෙයට පඤ්චද්වාරා වජ්ජන ක්‍රියා සිතයයි කියනු ලැබේ.

මනෝධාතුත්‍රිකය — මේ පඤ්චද්වාරාවජ්ජන ක්‍රියාසිත හා ඉහත කී සම්පටිච්ඡන සිත් දෙකද **මනොධාතු-ත්‍රික** නම් වේ.

මනෝද්වාරාවජ්ජන සිත — **මනොද්වාරාවජ්ජන** = මනෝද්වාර + ආවජ්ජන යන මෙහි භවාඞ්ග චිත්තයේ මනෝද්වාර නමි. **භවාඞ්ගයයි කියන ලද මනෝද්වාරයෙහි** ගැටෙන අරමුණු සයී අතුරෙන් ඒ ඒ අරමුණෙහි පළමුකොට එල්බගෙණ මෙනෙහි කරණ සිත **මනෝද්වාරාවජ්ජනය** යි. මෙයද ක්‍රියා සිතකි. දොරටුපාලයෙකු සේ මනෝද්වාරයෙහි ගැටෙන අරමුණට එම දොර හැරීමයි. මේ සිතම පඤ්චද්වාරයෙහිදී **ව්‍යවස්ථාපනකෘත්‍යය ද** සිදුකරයි. එනම්, ඇස්, කන්, ආදී දොරටු පහට හමුවන අරමුණු පිළිබඳව කෙසේ පැවතිය යුතුදැයි නියමකර ගැනීමයි. මේ ආවජ්ජන ක්‍රිය සිත් දෙක පෘථග්ජනයනට හා සෝවාන්, සකෘදගාමි, අනාගාමි, රහත් යන එලසඑ පුද්ගලයන්ට ද ලැබේ. මේ ආවජ්ජන දෙසිත නූපන්කල, කිසි වීථි සිතක් නූපදනා බව දතයුතුයි.

හසිතුප්පාද සිත — **හසිතුප්පාද** හසිත+උප්පාද යන මෙහි **හසිත** නම්, පිපුණු මලෙක මෙන් මුහුණේ පැවැති පෙම්ගතිය වූ **මඳසිනාවය**, **උප්පාද** යනු ඉපිදවීමයි, හසිතය උපදවානුයි **හසිතුප්පාද** නමි. එනම්, හසිතය සිනාව උපදවන සිතයි. අනුළාර අරමුණෙහි සිනහ උපදවන්නේ මේ සිතින්ය.

අනුළාර අරමුණු නම් :—අට්ඨිසඞ්ඛලික=ප්‍රේතයන් ආදී සියුම් අරමුණුය. හසිතුප්පාද කිරිය සිත බුදුරජාණන් වහන්සේට හා රහතන් වහන්සේට මිස අන්‍ය සත්ත්වයන්ට කිසිකලෙකත් ඇති නොවේ.

[අනුළාර අරමුණක් හමුවූ කල්හි උන්වහන්සේලාට මේ සිත පහළවන්නේ එවැනි දුගීති භවොත්පත්තියකින් මිදී තමන් වහන්සේට ලැබුණු ආත්ම භාව සම්පත්තිය වූ ඉටු අරමුණෙහි සතුටු වීමෙනි. උන්වහන්සේලා ලෞකික මහ ජනයා අප මෙන් උළාර අරමුණෙහි සිනා පහළ නො කෙරෙත්. ඒ උතුමන්ගේ සිනාවෙහි “හඃ! හඃ!!” යි ශබ්දයකුදු නො මැත. මේ හසිතුප්පාදය රූපාදී අරමුණු සයෙහි ම උපදී.]

[සොම්නස් සහගත ලෝභසිත් 4 ද, මහා කුසල් සොම්නස් සිත් 4 ද, මහාකිරිය සොම්නස් සිත් 4 ද, මේ සිතදෑසි සිනා උපදවන සිත් දහතුණකි. පෘථග්ජනයෝ ලෝභ මූල සිත් 4 ය, මහාකුසල්සිත් 4 ය යන සොම්නස් සිත් අටකින්ද, සෝවාන්–සකෘදාගාමි–අනාගාමි ඵලයන්හි පිහිටි ශෛක්ෂයෝ තිදෙන දිට්ඨිවිප්පයුත්ත ලෝභසිත් දෙකය, මහාකුසල්සිත් 4 ය යන සොම්නස් සිත් සයකින්ද රහතුන් වහන්සේ මහා කිරියසිත් 4 ය, හසිතුප්පාද සිතය යන සොම්නස් සිත් පහකින්ද සිනාසෙත්. * එසින් මෙහි කියනලද්දේ හසිතෝත්පාද සිතය. බුදුරජාණන්වහන් සේ ද රහත් උතුමෙකි.]

**කිරියසිත්**

**කිරියසිත්** යනු කිරීමෙන් පමණක් අවසන් වන සිත්ය. මොවුන්ට කුසල්–අකුසල්වලට මෙන් විපාක නැත. තව ද, ආවජ්ජන කිරිය

* සිතාසිත් කෙලෙසිත් අටක් වේ පුහුදුන්හට
සෙක්තට සයක් වේ සිත්—පසෙක් වේ රහතුන් හට

දෙසිත සමග ඉතිරි කිරියසිත් ද ලැබෙන්නේ රහතන් වහන්සේට ම පමණක්ය යි ද දතයුතුයි.

මේ සිත් දහඅට 18 උපදවන අන්‍ය හේතූන් ඇතද ලෝභය, ද්වේෂය, මෝහය, අලෝභය, අද්වේෂය, අමෝහය යන සම්ප්‍රයුක්ත=සිත හා යෙදෙන හේතූන් හා නො යේදෙන බැවින් මොවුහු අහේතුක නම් වෙත්. සෙසු සිත් සියල්ල පෙරකී හේතූන් හා යෙදෙන බැවින් සහේතුක නම් වෙත්. මේ සිත් දහඅට අරමුණු ආදිය හා එකතු වූ කල්හි බොහෝ සෙයින් ඉබේම වාගේ උපදනා බැවින් අසඞ්ඛාරික වෙත්.

ස්වරූප බෙදීම

[අහේතුකසිත්හි සුඛසහගතසිත් එකයි, දුක්ඛ සහගතසිත් එකයි, සොම්නස්සහගතසිත් දෙකයි, උපෙක්ඛාසහගතසිත් දහතරයයි බෙදීම ඉන්ද්‍රියභේදයෙනි. සුඛසහගතසිත් තුණය, දුක්ඛසහගතසිත් එකය, උපෙක්ඛාසහගතසිත් දහතරය යි බෙදීම අනුභවන=අරමුණුරස විඳීමේ භේදයෙනි. මේ සිත් දහඅටෙහි සම්ප්‍රයුක්තසිත් එකකුදු නැත. සියල්ලම විප්පයුත්තයි, අසඞ්ඛාරිකයි. සසඞ්ඛාරික සිත් නැත. ස්වරූප වින්‍යාසයෙහි එන අයුරින් ම ගණන් කරමින් මෙහි ද ස්වරූප විභාගය කළ යුතුයි.]

| 2 [අහේතුක සිත් අටළොසෙහි සහ අසෝභන සිත් තිසෙහි ස්වරූප වින්‍යාසයි. | | සුඛසහගත සිත් | සොම්නස්සහගත සිත් | දුක්ඛසහගත සිත් | දොම්නස්සහගත සිත් | උපේක්ෂාසහගත සිත් | සම්ප්‍රයුත්ත සිත් | විප්පයුත්ත සිත් | අසඞ්ඛාරික සිත් | සසඞ්ඛාරික සිත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අකුසල විපාක සිත් | 7 | – | – | 1 | – | 6 | – | 7 | 7 | – |
| කුසල විපාක ,, | 8 | 1 | 1 | – | – | 6 | – | 8 | 8 | – |
| අහේතුක කිරියා ,, | 3 | – | 1 | – | – | 2 | – | 3 | 3 | – |
| අහේතුක ,, | 18 | 1 | 2 | 1 | – | 14 | – | 18 | 18 | – |
| අකුසල් ,, | 12 | – | 4 | – | 2 | 6 | 8 | 4 | 7 | 5 |
| අසෝභන ,, | 30 | 1 | 6 | 1 | 2 | 20 | 8 | 22 | 25 | 5] |

අකුසල් සිත් දොළොස හා අහේතුක සිත් දහඅට ද ශෝභන චෛතසිකයන් හා නො යෙදෙන බැවින් අශෝභන නම් වෙති.*

## 12 වැනි පාඩම.

අශෝභනසිත් 30 හැර ඉතිරි පණස්නවය 59 ක් වූ හෝ අනූඑක 91 ක් වූ චිත්තයෝ සෝභන නම් වෙත්. ශ්‍රද්ධාව ආදී යහපත් ස්වභාවයෝ උතුමන්ට ඔබින බැවින් සෝභන නම් වෙත්. ඔවුන් හා යෙදෙන සිත් ද සෝභන නම් වෙත්.

* අකුසල සිත් දොලස–
සහ අහේතුක අටලොස
යන මේ සිත් තිහට
අසෝභන යයි කියති

## කාමසෝභන සිත් 24.

---

### කාමාවචර කුසල් සිත් අට.

1. සෝම්නස්සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත.
2. සෝම්නස්සහගත ඤාණසම්පයුත්ත සසඞ්ඛාරික සිත.
3. සෝම්නස්සහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරික සිත.
4. සෝම්නස්සහගත ඤාණවිප්පයුත්ත සසඞ්ඛාරික සිත.
5. උපෙක්ඛාසහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත.
6. උපෙක්ඛාසහගත ඤාණසම්පයුත්ත සසඞ්ඛාරික සිත.
7. උපෙක්ඛාසහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරික සිත.
8. උපෙක්ඛාසහගත ඤාණවිප්පයුත්ත සසඞ්ඛාරික සිත.

මේ සිත් අට මහාකුසල්සිත් යන නාමයෙන් ද හඳුන්වනු ලැබේ.

සොම්නස පෙර කී සේ ම ය. සොම්නස හා එක්ව යෙදුනේ- **සෝම්නස්සහගත** නම්.

[මහාකුසලචිත්තය සොම්නස් සහගත වීමට කරුණු සය 6 කි.

එනම් :—1 සොම්නස් සිතකින් උපන්නෙකු වීමය.
2 ශ්‍රද්ධාව බහුල ව ඇතිබව ය.
3 පිරිසුදු සම්‍යක්දෘෂ්ටිය ඇතිබව ය.
4 කුසලකර්මයන්හි අනුසස් දැකීම ය.
5 දානවස්තු-ප්‍රතිග්‍රාහකාදී ඉෂ්ට අරමුණු හා එක්වීමය.
6 පීඩා හිරිහැර කරදර නැතිබව ය.]

ඤාණසම්පයුත්ත

**ඤාණය නම් :**—කර්මඵල විශ්වාස කිරීම යන ආදී වශයෙන් ඇසට පෙණෙන්නාක්මෙන් යමක ඇති සැටි නුවණ නමැති ඇසින් දක්නා ප්‍රඥාව ය. ඤාණය හා එක් ව යෙදුනේ **ඤාණසම්පයුත්ත** නම්.

[මේ සිත ඤාණසම්පයුත්ත වීමට කරුණු පසකි. එනම් :—

1 ත්‍රිහේතුක සිතකින් උපන්නෙකු වීමයි.

2 දෞර්මනස් නැති භවයක=බඹලොව ඉපද සිටි බවයි.

3 ශ්‍රද්ධාව ආදී ඉඳුරන්ගේ මේරීම යි.

4 කෙලෙසුන් කෙරෙන් ඈත්වීම යි.

5 නුවණ වැඩෙන කටයුතු යි.]

ඤාණවිප්පයුත්ත

ඤාණය හා එක්ව නො යෙදුනේ **ඤාණ විප්පයුත්ත** නම්. මවු පිය ආදීන්ගේ වැඳුම් පිදුම් ආදී ප්‍රතිපත්ති යහපත් ගතිගුණ දැකීමෙන් හටගත් පුරුද්ද ඇති බාලදරුවෝ භික්ෂූන් දැක වඳිති. ඇතැම්විට තමන් අත තිබූ දෙය පුදති. මෙසේ කර්මඵල=පින් අනුසස් ආදිය නොදැන පුරුද්දෙන් කරන හැම කුසලයක්ම ඤාණවිප්පයුත්ත වේ.

[මේ සිත ඤානවිප්පයුත්ත වීමට ද හේතු වශයෙන් ඤාණසම්පයුත්තවීමේ කරුණුම වෙනස් කොට දතයුතු යි.]

උපේක්ෂාව පෙර කීසේ ම යි. **උපේක්ෂාව හා එක්ව යෙදුනේ උපෙක්ඛා සහගත** නම්.

[මහා කුසල චිත්තය උපේක්ෂාසහගත වීමට කරුණු සයකි. එනම් :—

1 උපේක්ෂා සිතකින් උපන්නෙකු වීම යි.

2 ශ්‍රද්ධාව මඳබව යි.

3 දෘෂ්ටිය අපිරිසුදු බව යි.

4 කුසලකර්මයන්හි අනුසස් නො දැනීම යි.

5 මධ්‍යස්ථ අරමුණක් හා එක්වීම ය.

6 පීඩා=කරදර සහිත බව ය.

මේ කරුණුවලින් හටගන්නා]

උපෙක්ෂා කුසලය සොම්නස් කුසලයට වඩා හීනයි.

| | |
|---|---|
| අසංඛාරික | පින් කිරීමේදී උනන්දු කරවීමක් නොමැතිව ඉබේම වගේ උපදනා සිත අසඞ්ඛාරිකයි. |
| සසංඛාරික | උනන්දු කරවීමක් ඇතිව උපදනා සිත සසඞ්ඛාරිකයි. |

[ඒ මෙසේය :—දන්දීම, උදේ සවස පන්සිල් සමාදන් වීම, තෙරුවන් වැඳීම, දෙගුරුන් ආදී වැඩිහිටියන් වැඳීම ඔවුන්ට සත්කාර කිරීම යන ආදී යහපත් පිළිවෙත්හි පුරුදු පුහුණු වූ තැනැත්තා නියම කාලවේලාව පැමිණි කල්හි උනන්දු කරවීමක් නොමැතිව ඉබේම වගේ උපන් තියුණුවූ සිතින්ම එය කරයිද එවිට ඒ කුසලය අසඞ්ඛාරික වන්නේය. ඇතැම් වාරයක නියම වේලාව පැමිණිවිට ද ඒ කටයුත්තෙහි යෙදීමට සිත මැලිවේ. පසුබට වේ. එවිට අනුන්ගේ මෙහෙයීමෙන් හෝ අපවාදයෙන් මිදීම, ලාභයක් නම්බුවක් බලාපොරොත්තුවීම නිසා ඇතිවූ තමන්ගේ මෙහෙයීමෙන් හෝ තො තියුණු වූ සිතින් එය කරයි ද, එවිට ඒ කුසලය සසඞ්ඛාරික වන්නේයි.

මහා කුසල් සිත අසඞ්ඛාරික වීමට කරුණු සය 6 කි. එනම් :—

1 අසඞ්ඛාරික කර්මයකින් උපන්නෙකු වීම යි.

2 පූර්ව භවයන්හි පින් කොට පුරුදු බව යි.

3 සුදුසු ඍතු භෝජනාදීන්ගේ උපකාරයෙන් කයත් සිතත් සුවපත් වීමය.

4 නුවණ මෝරණ වයසට පැමිණීම ය.

5 ශ්‍රද්ධා ප්‍රඥාවන් සම්පූර්ණවීම ය.

6 සිත්වූ පරිදි දන වස්තු හා ප්‍රතිග්‍රාහකයන් ලැබීම ය. ]

කාමාවචර කුසල් බොහෝ විපාක උපදවත්.

මහා කුසල් [ ඒ කවරහුදයත්? දිව්‍යලෝක-මනුෂ්‍ය ලෝක දෙක්හි උත්පත්ති නවයක් ද, දිව්‍ය ලෝක මනුෂ්‍යලෝක-රූපලෝකාදියෙහි ප්‍රවෘත්තිවිපාක වශයෙන් සැප විපාක දහසයක් ද යන මොහු ය. මෙසේ ලෝකයෙහි ඇතුළත බොහෝ තැන්වල බොහෝ විපාක දෙන බැවින් **මහාකුසල** යන නම ව්‍යවහාර කරනු ලැබේ.]

කුසල **කුසල්** නම්, නිවැරදි සැප විපාක උපදවන ස්වභාවයෝය. තවද කුසලයෙන් කරනු ලබන්නේ අකුසල් දුරුකිරීමයි. කුසලය රෝග දුරුකරන බෙහෙතක් මෙනි. අකුසලය රෝගයක් මෙනි.

[කාමාවචර කුසල සිත සොම්නස්-උපේක්ෂා යන වේදනා භේදයෙන් දෙකක් වේ. ඒ දෙක ඤාණසම්ප්‍රයුක්ත-විප්‍රයුක්ත භේදයෙන් හතරක් වේ. ඒ සතර අසංඛාරික-සසංඛාරික භේදයෙන් අටක් වන්නේය.]

කාමාවචර කුසල් සිත් අට අලෝභ, අද්වේෂ, අමෝහ යන සම්ප්‍රයුක්ත හේතූන් හා එක්ව යෙදෙති. එහෙයින් ඔවුහු සහේතුක සිත් වෙති. එහෙත් කථාව්‍යවහාරයෙහිදී ඔවුන්ට සහේතුක කුසලයයි නොකියති. අහේතුක කුසල් නැති බැවිනි.

## 13 පාඩම.

# මහාකුසල් සිත් අට ලැබෙන ආකාරය.

---

[1 යමෙක් දානවස්තු-ප්‍රතිග්‍රාහක සම්පත් ආදී ඉෂ්ට අරමුණක් ලැබීමෙන් **සොම්නස්සහගතව** කර්ම්ඵල සැල කීම් ආදිය නිසා **ඤාණසම්පයුත්තව** පින්කොට පුරුද්ද ඇති නිසා ඉබේම වගේ උපදනා තියුණුවූ **අසඞ්ඛාරික** සිතින් මල් පහන් පිදීම, දන්දීම, සිල්රැකීම් ආදී පිනක් කරයි ද එකල ඔහුට පළමු වැනි මහාකුසල් සිත ලැබෙන්නේ යි.

2 කිසිවෙක් දානවස්තු-ප්‍රතිග්‍රාහක සම්පත් ආදී ඉෂ්ට අරමුණක් ලැබීම නිසා **සොම්නස්සහගත** ව කර්ම්ඵල සැලකීම් ආදිය නිසා **ඤාණසම්පයුත්තව** "පින්වත, දන් දෙන්න, පින්කරන්න" යි අනුන් විසින් උනන්දුකරවන ලදුව හෝ ලාභ ප්‍රයෝජන ආදිය බලාපොරොත්තුවීමෙන් තමන් ම උනන්දු වීමෙන් හෝ මෙහෙයීමක් ඇතිව, මොටවූ **සසඞ්ඛාරික** සිතින් පිණක් කරයි ද එකල ඔහුට දෙවැනි මහාකුසල් සිත ලැබෙන්නේ ය.

3 යම්කිසි කුඩා දරුවෙක් තමන්ට ප්‍රිය වූ හඳුනන සවාමීන් වහන්සේ නමක් දැක **සොම්නස්සහගතව** කර්ම්ඵල දන්නා ඤාණය නැති නිසා **ඤාණවිප්පයුත්තව** මවුපියන් ගේ වැඳුම් පිදුම් දැක පුරුද්ද ඇති බැවින් ඉබේම වගේ උපදනා තියුණු වූ **අසඞ්ඛාරික** සිතින් වඳියි ද අත තිබූ දෙයක් හෝ පුදයි ද එවිට ඒ දරුවාට තුන්වැනි මහාකුසල් සිත ලැබෙන්නේ යි.

4 යම් කුඩාදරුවෙක් තමන්ට ප්‍රියවූ සවාමීන් වහන් සේ නමක් දැක **සොම්නස්සහගත** ව කර්ම්ඵල සලකන ඤාණය නැති නිසා **ඤාණවිප්පයුත්තව** "පුතා, වඳින්න, පුදන්න" යි මවුපියන් විසින් උනන්දු කරන ලදු ව මෙහෙයීමක් ඇතුව මොට වූ **සසඞ්ඛාරික** සිතින් වැඳුම් පිදුම් කරයි ද එකල ඔහුට සතර වන මහා කුසල් සිත ලැබෙන්නේය.

5 යම්කිසිවෙක් ශ්‍රද්ධාව මඳබව නිසා **උපෙක්ඛාසහගතව** නුවණ වැඩෙන කටයුතු ආදියේ නිසා **ඤාණසම්පයුත්තව** කය හා සිත සුවපත්වීම නිසා මෙහෙයීමක් නැතිව ඉබේම වගේ උපදනා **අසඞ්ඛාරික** සිතින් පිනක් කරයි ද එකල ඔහුට පස්වන මහා කුසල්සිත ලැබෙන්නේය.

6 කිසිවෙක් මධ්‍යස්ථ අරමුණක්ලැබීමනිසා **උපෙක්ඛාසහගතව** නුවණ වැඩෙන කටයුතු නිසා **ඤාණසම්පයුත්තව** අනුන් විසින් උනන්දු කරවන ලදු ව හෝ තමන්ම උනන්දුවීමෙන් හෝ මොට වූ **සසඞ්ඛාරික** සිතින් පිනක් කරයි ද එකල ඔහුට සය වැනි මහා කුසල් සිත ලැබෙන්නේය.

7 නූගත් කෙනෙක් තමන්ගේ ගෙදරට හිඟමනක් ඉල්ලා පැමිණි හිඟන්නෙකු දැක ශ්‍රද්ධාව මඳබව නිසා **උපෙක්ඛාසහගත** ව කම්විල නො දන්නා නිසා **ඤාණවිප්පයුත්ත** ව ඉතිරි වූ ආහාරයක් ඇති බැවින් මෙහෙයීමක් නැතිව ඉබේ ම වගේ උපදනා තියුණු වූ **අසඞ්ඛාරික** සිතින් ඒ හිඟන්නාට ඒ ආහාරය දෙයි ද එවිට ඔහුට සත් වැනි මහාකුසල්සිත ලැබෙන්නේ ය.

8 යම්කිසි කෙනෙක් තමන්ගේ ගෙදරට සිඟමනක් ඉල්ලා පැමිණි හිඟන්නා දැක ශ්‍රද්ධාව මඳ නිසා **උපෙක්ඛාසහගත** ව කම්විල නොදත් නිසා **ඤාණවිප්පයුත්ත** ව දන්දීමෙහි පුරුද්දක් නැති බැවින් අනුන් විසින් උනන්දු කරවන ලදු ව හෝ තමන් ම උනන්දුවීමෙන් හෝ මොටවූ **සසඞ්ඛාරික** සිතින් ඒ හිඟන්නාට යමක් දෙයි ද එවිට ඔහුට අටවෙනි මහාකුසල්සිත ලැබෙන්නේය.]

**[මහාකුසල් නිමි.]**

## 14 වැනි පාඩම.

# සහේතුක කාමාවචර විපාක සිත් අට.

---

1 සොමනස්සසහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරිකසිත.
2 සොමනස්සසහගත ඤාණසම්පයුත්ත සසඞ්ඛාරිකසිත.
3 සොමනස්සසහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරිකසිත.
4 සොමනස්සසහගත ඤාණවිප්පයුත්ත සසඞ්ඛාරිකසිත.
5 උපෙක්ඛාසහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරිකසිත.
6 උපෙක්ඛාසහගත ඤාණසම්පයුත්ත සසඞ්ඛාරිකසිත.
7 උපෙක්ඛාසහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරිකසිත.
8 උපෙක්ඛාසහගත ඤාණවිප්පයුත්ත සසඞ්ඛාරිකසිත.

මේ සහේතුක කාමාවචර විපාකසිත් අට මහාකුසල යන්ගේ විපාක වූ බැවින් මහාවිපාක නාමයෙන් ද හඳුන්වනු ලැබේ. අහේතුක කුසල විපාකයන්ගෙන් වෙන්කර ගැනීම පිණිස මෙහි සහේතුකයි කියයුතුය. සත්වයකු තුළ උපන් කාමාවචර කුසලය ලා අවස්ථාව ඉක්මවා පැසුණුකල්හි විපාකය යි වෙන නමකින් උපදනේය. මහා විපාක සිත් අටම මහාකුසලයන්ගේ විපාකයෝය.

[ඔවුහු සත්වයෙකුගේ පිළිසිඳීමේදී ප්‍රතිසන්ධි විපාක යන නමින් ද ඊටපසු ඒ සත්වයා ජීවත්වන කල්හි භවාඞ්ග යන නමින්ද මැරෙන කල්හි චුති යන නමින් ද උපදනාහුය. තවද ඒ මහාකුසලයෝ සත්වයා ජීවත්ව සිටින කල්හි ඇස ආදී සදෙරෙහි චක්ඛුවිඤ්ඤාණාදී අහේතුක කුසල විපාක සිත් අට ද ප්‍රවෘත්ති විපාක වශයෙන් උපදවත්. **ප්‍රවෘත්තිවිපාක** නම් ජීවත්ව සිටින කාලයෙහි සත්වශරීරය තුළ ඇතිවන විපාකසිත්ය. මහා විපාක සිත ද සොමනස් උපේක්ෂා යන වේදනා භේදයෙන් දෙකක් වේ. ඒ දෙක ඤාණසම්පයුත්ත-ඤාණවිප්පයුත්ත භේදයෙන් සතරක් වේ. ඒ සතර අසඞ්ඛාරික සසඞ්ඛාරික භේදයෙන් අටක් වේ. ]

## සහේතුක කාමාවචර කිරිය සිත් අට.

1 සොම්නස්සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත.

2 සොම්නස්සහගත ඤාණසම්පයුත්ත සසඞ්ඛාරික සිත.

3 සොම්නස්සහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරික සිත.

4 සොම්නස්සහගත ඤාණවිප්පයුත්ත සසඞ්ඛාරික සිත.

5 උපෙක්ඛාසහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත.

6 උපෙක්ඛාසහගත ඤාණසම්පයුත්ත සසඞ්ඛාරික සිත.

7 උපෙක්ඛාසහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරික සිත.

8 උපෙක්ඛාසහගත ඤාණවිප්පයුත්ත සසඞ්ඛාරික සිත.

මේ සිත් අට අහේතුක කිරියචිත්තයන් කෙරෙන් වෙන්කර ගැනීම පිණිස මෙහි සහේතුක යි කියනු ලැබේ.

[මහාකුසලයන් මෙන් හටගන්නා මොවුන්ට මහාකිරිය සිත් යන නම ද ලැබේ. මේ සිත් අට මහාකුසල් සිත් අට හා සමානව ම උපදිත්. වෙනස නම්, මහාකුසල්සිත් අට පෘථග්ජනයන්ටත් සෝවාන්-සකෘදාගාමි-අනාගාමි යන ආර්ය්‍යපුද්ගලයන්ටත් පින් කිරීමේ දී ලැබෙති.]

මහාකිරියසිත් අට ලැබෙන්නේ රහතුන් වහන්සේට පමණකි. උන්වහන්සේ බුදුන් වැඳීම, මල්පහන් පිදීම, වත්පිළිවෙත්කිරීම ආදී පුණ්‍යක්‍රියාවන්හි නිතර යෙදෙත්. එවිට උන්වහන්සේට උපදනා පින් සිත්වලට කිරිය සිත් යයි කියනු ලැබේ. මුල්කැපූ ගස්වල වැල්වල පිපෙන ගෙඩි නූපදවන මල්මෙන් කිරීමෙන් පමණක් අවසන්වන-විපාක නූපදවන සිත් **කිරිය සිත්ය.**

[මේ කිරිය සිත ද සොම්නස්-උපේක්ෂා යන වේදනා භේදයෙන් දෙකක් වේ. ඒ දෙක ඤාණසම්පයුත්ත-ඤාණ විප්පයුත්ත වශයෙන් සතරක් වේ. ඒ සතර ද අසඞ්ඛාරික සසඞ්ඛාරික විසින් අටක් වේ. මෙසේ කාමසෝභන සිත් සූවිස්සක්ම වෙත්.]

මේ සිත් සූවිස්ස අලෝභ, අද්වේස, අමෝහ යන හේතු තුණ හා යෙදෙන හෙයින් සහේතුක නම් වෙත්. මෙහි අමෝහ යනු ඤාණයයි. අමෝහය ඇති සිත් දොළසකි. ඒ දොළොසම ත්‍රිහේතුකය. ඤාණසම්ප යුත්ත නමි. අමොහය=ඤාණය නැති සිත් දොළොස ද්විහේතුකය. ඤාණවිප්පයුත්ත නමි.

සවරූප බෙදීම [සොම්නස්සහගත සිත් දොළොසය, උපේක්ෂා සහගත සිත් දොළොසය යි සූ විස්සය, සම්පයුත්ත සිත් දොළොසය, විප්ප යුත්ත සිත් දොළොසය යි සූවිස්සය, අසඞ්ඛාරික සිත් දොළොසය, සසඞ්ඛාරික සිත් දොළොසය යි සූවිස්සය. මෙසේ ද බෙදිය යුතුයි.]

**කාමසෝබන සිත් සූවිස්ස නිමි.**

| 3<br>[කාමසෝභන සිත් 24 හි ස්වරූප ප්‍රභේද වින්‍යාසය] | | සෞමනස්සසහගත සිත් | දෝමනස්සසහගත සිත් | උපේක්ෂාසහගත සිත් | සම්ප්‍රයුක්ත සිත් | විප්‍රයුක්ත සිත් | අසඞ්ඛාරික සිත් | සසඞ්ඛාරික සිත් |
|---|---|---|---|---|---|---|---|---|
| කාමාවචර කුසල් | සිත් 8 | 4 | 0 | 4 | 4 | 4 | 4 | 4 |
| සහේතුකකාමාවචර විපාක | ,, 8 | 4 | 0 | 4 | 4 | 4 | 4 | 4 |
| සහේතුකකාමාවචර කිරිය | ,, 8 | 4 | 0 | 4 | 4 | 4 | 4 | 4 |
| කාමසෝභන | ,, 24 | 12 | 00 | 12 | 12 | 12 | 12 | 12 |

| 4<br>[කාමාවචර සිත් 54 හි ස්වරූප වින්‍යාසය ජාතිභේදයෙනි] | | සුඛසහගත සිත් | සෞමනස්සසහගත සිත් | දුඃඛ සහගත සිත් | දෝමනස්සසහගත සිත් | උපේක්ෂාසහගත සිත් | සම්ප්‍රයුක්ත සිත් | විප්‍රයුක්ත සිත් | අසඞ්ඛාරික සිත් | සසඞ්ඛාරික සිත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අකුසල් | සිත් 12 | – | 4 | – | 2 | 6 | 8 | 4 | 7 | 5 |
| කුසල් | ,, 8 | – | 4 | – | – | 4 | 4 | 4 | 4 | 4 |
| විපාක | ,, 23 | 1 | 5 | 1 | – | 16 | 4 | 19 | 19 | 4 |
| කිරිය | ,, 11 | – | 5 | – | – | 6 | 4 | 7 | 7 | 4 |
| කාමාවචර | ,, 54 | 1 | 18 | 1 | 2 | 32 | 20 | 34 | 37 | 17 |

ස්වරූප නොලැබෙන බව 0 –මේ ලකුණුවලින් හඟවයි.

## 15 වැනි පාඩම.

# රූපාවචර චිත්තය.

---

කුසල්සිත් පසෙක, විපාකසිත් පසෙක, කිරියසිත් පසෙකැයි රූපාවචර චිත්තය පසළොස්=15 වැදෑරුම් වේ.

### රූපාවචර කුසල්සිත් පහ.

1 **විතක්ක විචාර පීති සුඛ එකග්ගතා සහිත පඨමජ්ඣාන කුසල් සිත.**
2 **විචාරපීතිසුඛ එකග්ගතා සහිත දුතියජ්ඣාන කුසල් සිත.**
3 **පීතිසුඛ එකග්ගතා සහිත තතියජ්ඣාන කුසල් සිත.**
4 **සුඛ එකග්ගතා සහිත චතුත්ථජ්ඣාන කුසල් සිත.**
5 **උපෙක්ඛා එකග්ගතා සහිත පංචමජ්ඣාන කුසල්සිත.**

මේ රූපාවචර කුසල්සිත් පසය.

විතර්ක, විචාර, ප්‍රීති, සුඛ, ඒකාග්‍රතා යන අඞ්ග පස කින් යුත් ධ්‍යානය පළමුකොට උපදින හෙයින් **ප්‍රථම-ධ්‍යාන** නම් වේ. ඒ ප්‍රථමධ්‍යානය හා එකට යෙදී උපදින කුසල්සිත **පඨමජ්ඣාන කුසල්සිතය.**

විචාර, ප්‍රීති, සුඛ, ඒකාග්‍රතා යන අඞ්ග හතරකින් යුත් ධ්‍යානය දෙවැනිව උපදින හෙයින් **ද්විතීයධ්‍යාන** නම් වේ. ඒ ද්විතීය ධ්‍යානය හා එකට යෙදී උපදින කුසල් සිත **දුතියජ්ඣාන කුසල් සිතය.**

ප්‍රීති, සුඛ, ඒකාග්‍රතා යන අඞ්ග තුනකින්යුත් ධ්‍යානය තුන්වැනිව උපදින හෙයින් **තෘතීයධ්‍යාන** නම් වේ. ඒ තෘතීයධ්‍යානය හා එකට යෙදී උපදින කුසල්සිත **තතියජ්ඣාන කුසල්සිතය.**

සුඛ, ඒකාග්‍රතා යන අඞ්ග දෙකකින් යුත් ධ්‍යානය හතර වැනිව උපදින හෙයින් **චතුර්ථධ්‍යාන** නම් වේ. ඒ චතුර්ථධ්‍යානය හා එකට යෙදී උපදින කුසල්සිත **චතුත්ථජ්ඣාන කුසල්සිතය.**

උපේක්ෂා ඒකාග්‍රතා යන අඞ්ග දෙකකින්යුත් ධ්‍යානය පස්වැනි ව උපදින හෙයින් **පඤ්චමධ්‍යාන** නම් වේ. ඒ පඤ්චමධ්‍යානය හා එකට යෙදී උපදින කුසල් සිත **පඤ්චමජ්ඣාන කුසල් සිතය.**

විතර්කය, විචාරය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාවය යන චෛතසික වෙන් වෙන් වශයෙන් **ධ්‍යාන අඞ්ග**=ධ්‍යාන පිළිබඳ අවයව යයි ද ඒ ධ්‍යාන අඞ්ගයන්ගේ සමූහය **ධ්‍යාන** යයි ද කියනු ලැබේ.

[රෝද, ඊරියකඳ, වියගහ, තට්ටුව, අමරුව යන රථ අවයවයෝ වෙන වෙන ම රථ අඞ්ගයයි ද, රථ අඞ්ගයන්ගේ එකට ගැළපූ සමූහය රථ යයි ද කියනු ලබන්නාක් මෙනි.]

ධ්‍යානයාගේ සහ ධ්‍යාන අඞ්ගයන්ගේ වෙනස මෙසින් දතයුතු සි. ධ්‍යානචිත්තය යනු ද ධ්‍යානය නොව එය හා එකට යෙදුණු සිත යි.

[“**ඣායති උපනිජ්ඣායතීති ඣානං**” භාවනා අරමුණකරා එළඹ සිහි නුවණ මෙහෙයා බලන හෙයින් **ධ්‍යාන** නම් වේ.

ධ්‍යානය

ධ්‍යානය වනාහි ලක්ෂණ උපනිජ්ඣානය ආරම්මණ උපනිජ්ඣායනය යි දෙවැදෑරුම් වේ. එහි විදර්ශනා මාර්ග ඵලයෝ අනිත්‍ය ලක්ෂණාදිය කරා එළඹ බලන හෙයින් ලක්ඛණ උපනිජ්ඣා-න නම් වෙත්. අට වැදෑරුම් වූ හෝ නව වැදෑරුම් වූ ධ්‍යානය කසිණ ආදී අරමුණු කරා එළඹ බලන හෙයින් ආරම්මණ උපනිජ්ඣානය සි ව්‍යවහාර කරණු ලැබේ. මෙහි කියනු ලබන්නේ මේ දෙවනු කී ධ්‍යානය මැයි. ධ්‍යානය හිත එක් අරමුණෙක්හි පිහිටුවයි. එය කරන්නේ හැම ධ්‍යානයක ම යෙදෙන ඒකාග්‍රතාව යි. සිත නොයෙක් අරමුණුවල විසිරෙන්ට ඉඩනොදී එක් අරමුණෙක්හි ම

පිහිටුවන නිසා **සමාධි** යනුද ඒකාග්‍රතාවට නමකි. විතක්ක විචාර ආදිය ධ්‍යාන නම් වන්නේ ඒකාග්‍රතාවට අතිශයින් උපකාරවන බැවිනි. ]

ඒ මෙසේය; **විතර්කය** අරමුණට සිත නගවයි.=පමුණුවයි. **විචාරය** විතර්කයෙන් නැංවූ සිත අරමුණෙහි හසුරුවයි. **ප්‍රීතිය** අරමුණෙහි සිත පිණවයි. **සුඛය** නම් සියුම් වූ සොම්නසය.* එය සිත සුවපත්කොට වැඩි දියුණු කරයි. **උපෙක්ෂාවද** සිත සනසන බැවින් සුඛයෙහි ම ඇතුළත් වේ. විතර්ක ආදිය නිසා සිත එකඟ කරවීම **ඒකාග්‍රතාව ය.** මෙසේ ඒකාග්‍රතාව විතර්ක ආදීන්ගේ උපකාරය ලැබ අතිශයින් බලවත්ව, සිතට නොයෙක් අරමුණු කරා විසිර යන්ට ඉඩ නොදී කසිණ නිමිත්ත ආදී අරමුණට ම සිත යොමුකර තබයි. මෙසේ මෙය උපනිධ්‍යාන අරමුණකරා එළඹ බලන අර්ථයෙන් ද ධ්‍යාන නම් වේ.

තවද මෙය **"පච්චනීක ධම්මෙ ඣාපෙතීති ඣානං"** ප්‍රත්‍යනීක=විරුද්ධ කාමච්ඡන්දය ආදී නීවරණ ධර්මයන් දවන හෙයින් ද **ධ්‍යාන** නම් වේ. ඒ මෙසේයි:—

**විතර්කය** තෙම ථීනමිද්ධනීවරණය=චිත්තචෛතසිකයන්ගේ මැලිබව ද, **විචාරය** විචිකිච්ඡානීවරණය=සැකය ද, **ප්‍රීතිය** ව්‍යාපාද නීවරණය=වෛරය ද, **සුඛය** උද්ධච්චකුක්කුච්ච නීවරණය=නොසන්සුන් බව හා පසුතැවිල්ල ද, උපේක්ෂාව=සංසුන් පැවතුම් ඇති බැවින් සුඛයෙහි ඇතුළත් ව සියුම් උද්ධච්චකුක්කුච්චය ද, **ඒකාග්‍රතාව කාමච්ඡන්දය**=බලවත් කාමතෘෂ්ණාව ද, දවයි. මෙහි දැවීම නම් ඒ ඒ නීවරණයන් දුරුකිරීමයි; හෙවත් යටපත් කිරීමයි. චිත්තසන්තානයෙහි කුසල් ඇති නොවනසේ ආවරණය කරණ අර්ථයෙන් කාමච්ඡන්ද ආදීන්ට නීවරණයයි කියනු ලැබේ. ධ්‍යානයෙන් නීවරණ

* මෙය මානසික සුඛවේදනාව ය. කායික සුඛවේදනාව නො වේ. කායිකසුඛවේදනාව සුඛසහගත කායවිඥානයෙහි ය.

යන්ගේ පරියුට්ඨාන=නැඟීසිටින අවස්ථාවම දුරුකරනු ලැබේ. මෙහි විතර්කාදීහු සිත එකඟකිරීමට විරුද්ධ ව පවත්නා ථීනමිද්ධය ආදී නීවරණයන් දවා හැර දුරු කොට ඒකාග්‍රතාවට උපකාර වෙත්. මෙසේ විරුද්ධ ක්ලේශයන් දවන අර්ථයෙන් ද ධ්‍යාන නම් වේ.

## ධ්‍යාන සිත් උපදවන ආකාරය.

[ ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ලත් පිරිසුදු සිල් ඇති යෝගාවචරයෙක්=භාවනා කරන්නෙක් පළිබොධ=කරදරයට හේතු කරුණුවලින් වෙන් ව කර්මස්ථාන=භාවනා අරමුණු උගන්වන ගුරුවරයෙකු වෙත ගොස් කර්මස්ථාන සතළිස 40 අතුරෙන් තමන්ගේ චරිතයට ගැළපෙන කමටහනක් පරීක්ෂාකිරීමේදී ඉදින් පඨවිකසිණය තමන්ට සුදුසු නම් එය කර්මස්ථානය වශයෙන් ලබාගෙන ධ්‍යාන භාවනාවට නුසුදුසු තැන් අත්හැර සුදුසු තැනෙක වෙසෙමින් කසිණ මණ්ඩලය ඉදිරියෙහි “**පඨවි පඨවි**” යි කියමින් සිතමින් සියලු භාවනාවිධිය නොපිරිහෙලා වෑයම් කරයි ද එකල ඔහුට විතර්කාදී අඞ්ග පසකින් යුත් ප්‍රථමධ්‍යාන කුසල්සිත ලැබෙන්නේය.

මෙසේ පළමු වැනි ධ්‍යානයෙන් නීවරණ පහ දුරු කරයි. ඉතිරි ධ්‍යානයන් පිණිස වෑයම්කරණ යෝගීතෙම සිය අදහස් සපලවීමෙන් දෙවැනි ධ්‍යානයෙන් විතර්කය දුරුකරයි. තුන්වැනි ධ්‍යානයෙන් විචාරය ද, හතරවැනි ධ්‍යානයෙන් ප්‍රීතිය ද, පස්වැනි ධ්‍යානයෙන් සුඛය ද, දුරු කරමින් ගොස් පිළිවෙළින් හිතේ දැඩිගතිය අඩුකොට සියුම් බවට පමුණුවා ගන්නේය.

ධ්‍යාන භාවනාව නව වැනි කාණ්ඩයෙහි දී විස්තර කරණු ලැබේ. ]

රූපාවචර කුසල්සිත් පහ ලැබෙන්නේ ත්‍රිහේතුක සිතකින් පිළිසිඳගත්-කර්මාවරණ දී අන්තරායික=බාධා කරණ ධර්මයන්ගෙන් තොරවූ පුද්ගලයන්ටය. *

ඔව්හු නම් ත්‍රිහේතුක පෘථග්ජනයා සහ සෝවාන්, සකෘදාගාමි, අනාගාමි ඵලස්ථයන් තුන්දෙනා ද යන මේ සතරදෙනාය.

## 16 වැනි පාඩම.

## රූපාවචර විපාකසිත් පහ.

---

1 විතක්ක විචාර පීති සුඛ ඒකග්ගතා සහිත පඨමජ්ඣාන විපාකසිත.

2 විචාර පීති සුඛ ඒකග්ගතා සහිත දුතියජ්ඣාන විපාකසිත.

3 පීති සුඛ ඒකග්ගතා සහිත තතියජ්ඣාන විපාකසිත.

4 සුඛ ඒකග්ගතා සහිත චතුත්ථජ්ඣාන විපාකසිත.

5 උපෙක්ඛා ඒකග්ගතා සහිත පඤ්චමජ්ඣාන විපාකසිත.

මෙය රූපාවචර විපාක සිත් පහය; හෙවත් රූපාවචර කුසලයන්ගේ ලා කාලය ඉක්මගොස් පැසුණු අවස්ථාවට පැමිණි සිත් පහය. මේ විපාක සිත් පහ ඉහත දැක්වූ රූපාවචර කුසල්සිත් පහට සමානව උපදී.

---

* කර්මාවරණ, ක්ලේශාවරණ, විපාකාවරණ, උපවාදවරණ, ආඥාව්‍යතික්‍රමාවරණ යි අන්තරායික ධර්ම පහකි. කර්මාවරණ නම්, මවුමැරීම ආදී ආනන්තරිය කර්ම පහය. ක්ලේශාවරණ නම් නියත මිථ්‍යාදෘෂ්ටිය, විපාකාවරණ නම්, ද්විහෙතුක අහෙතුක ප්‍රතිසන්ධිය, උපවාදවරණ නම්, ආර්යයන්ට උපවාද=නින්දාබස් කීමය, ආඥාව්‍යතික්‍රමාවරණ නම් දූන දූන ඉක්මවූ=කඩකරන ලද ශික්ෂාපදය මේ පහ ධ්‍යාන මාර්ගඵලත් සවර්ගයත් අහුරණ බැවින් ආවරණ නම් වෙත්. එසේම ධ්‍යාන ආදියට අන්තරාය කරණ බැවින් අන්තරායික ධර්මනමුදු වෙත්.

[ඒ ධ්‍යාන කුසලයන් අතුරෙන් යම්කිසි කුසලයක් උපදවාගත් තැනැත්තාට ඒ ධ්‍යානයෙන් නොපිරිහී චුත වීමේදී තමන් විසින් ලබාගත් එම ධ්‍යාන කුසලය පැසී ගොස් එයට සමාන වූ සිතක් විපාක යන නමින් එයට සුදුසු බ්‍රහමභූමියක පිළිසිඳීම් වශයෙන් හටගනී. ඒ සිතට “පටිසන්ධි” යයි කියනු ලැබේ. ඉක්බිති එහි පිළිසිඳගත් ඒ බ්‍රහමයා ජීවත් ව සිටිනතාක්ම ඒ සිත=වීථි සිත් නොඋපදනා කල්හි “භවාඞ්ග” යන නමින් උපදී. මැරෙන කල්හි “චුති” යන නමින් ඇතිවන්නේත් ඒ සිතය. මෙසේ එක් එක් කුසල් සිතකට එක් එක් විපාක සිත බැගින් රූපාවචර කුසල් සිත් පහට ඒ හා සමාන වූ විපාක සිත් පහක් ලැබෙන බව දතයුතු සි. මේ සිත් පහ ලැබෙන්නේ ඉහතකී පුද්ගලයන් සතරදෙනාට ය.]

## රූපාවචර කිරිය සිත් පහ.

**1 විතක්ක විචාර පීති සුඛ ඒකග්ගතා සහිත පඨමජ්ඣාන කිරිය සිත.**

**2 විචාර පීති සුඛ ඒකග්ගතා සහිත දුතියජ්ඣාන කිරිය සිත.**

**3 පීති සුඛ ඒකග්ගතා සහිත තතියජ්ඣාන කිරිය සිත.**

**4 සුඛ ඒකග්ගතා සහිත චතුත්ථජ්ඣාන කිරිය සිත.**

**5 උපෙක්ඛා ඒකග්ගතා සහිත පඤ්චමජ්ඣාන කිරිය සිත.**

රූපාවචර ධ්‍යාන සිත් පහ රහත් නොවූවන් තුළ උපන් කල්හි කුසල් සිත් සි ද රහත් උතුමෙකු විසින් ලද කල්හි කිරියා සිත් සි ද කියනු ලැබේ.

[තවද රහත්වීමෙන් පසු ධ්‍යාන ලැබූ රහතන් වහන්සේටත් රහත් වන්ට පෙර ධ්‍යාන ලබා සිටි රහතන් වහන්සේටත් බුදු-පසේබුදුවරයන්ටත් රූපධ්‍යානවලට සම වැදීමේදී උපදින්නේ මේ කිරියා සිත් පහය.

ස්වරූප බෙදීම

රූපාවචර සිත් 15 හි ප්‍රථම ධ්‍යාන සිත් 3 ය, ද්විතීය ධ්‍යාන සිත් 3 ය, තෘතීය ධ්‍යාන සිත් 3 ය, චතුර්ථ ධ්‍යාන සිත් 3 ය යන සිත් දොළොස සොම්නස් සහගතය. පඤ්චමධ්‍යාන සිත් 3 උපේක්ෂාසහගතය. ධ්‍යානයන් හා සම්ප්‍රයුක්තවන බැවින් මේ සිත් 15 ම සම්පයුක්ත ය. සසඞ්ඛාරිකය.]

| 5 [ රූපාවචර සිත් 15 හි ස්වරූප ප්‍රභෙද වින්‍යාසය. | | සෝමනස්සසහගත සිත් | දෝමනස්සසහගත ,, | උපේක්ෂාසහගත ,, | සම්ප්‍රයුක්ත ,, | විප්‍රයුක්ත ,, | අසංඛාරික ,, | සසංඛාරික ,, | ප්‍රථමධ්‍යාන ,, | ද්විතීයධ්‍යාන ,, | තෘතීයධ්‍යාන ,, | චතුර්ථධ්‍යාන ,, | පඤ්චමධ්‍යාන ,, |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කුසල් | සිත් 5 | 4 | 0 | 1 | 5 | 0 | 0 | 5 | 1 | 1 | 1 | 1 | 1 |
| විපාක | ,, 5 | 4 | 0 | 1 | 5 | 0 | 0 | 5 | 1 | 1 | 1 | 1 | 1 |
| කිරිය | ,, 5 | 4 | 0 | 1 | 5 | 0 | 0 | 5 | 1 | 1 | 1 | 1 | 1 |
| රූපාවචර | ,, 15 | 12 | 00 | 3 | 15 | 00 | 00 | 15 | 3 | 3 | 3 | 3 | 3] |

**රූපාවචර සිත් 15 නිමි.**

## 17 වැනි පාඩම.

# අරූපාවචර චිත්තය.

කුසල්සිත් හතරය, විපාකසිත් හතරය, කිරියසිත් හතරය යි අරූපාවචර චිත්තය දොළොස් 12 වැදෑරුම් වේ.

### අරූපාවචර කුසල්සිත් හතර.

1 ආකාසානඤ්චායතන කුසල සිත.
2 විඤ්ඤාණඤ්චායතන කුසල සිත.
3 ආකිඤ්චඤ්ඤායතන කුසල සිත.
4 නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කුසල සිත.

මේ සිත් හතර අරූපාවචර කුසල්සිත් ය. රූපාවචර පඤ්චමධ්‍යානය උපදවාගත් යෝගාවචරයා විසින්

[ගන්නා ලද=ආකාස කසිණයෙන් අන්‍යවූ පඨවි කසිණය ආදී නව වැදෑරුම් කසිණයන් අතුරෙන් යම් කිසි කසිණයක් උගුළුවා=සිතින් අත්හැර ලත්]

අහස අරමුණුකොට අනන්ත වශයෙන් භාවනා කරණ කල්හි එම භාවනාව මස්තකප්‍රාප්ත වීමෙන් උපේක්ෂා-ඒකාග්‍රතා යන අඞ්ග දෙකින් යුක්තව පහළ වන්නේ ආකාසානඤ්චායතන ධ්‍යානය යි. ඒ ධ්‍යානය හා එකට යෙදී උපදින කුසල්සිත **ආකාසානඤ්චායතන කුසල් සිත ය.**

එම ආකාසානඤ්චායතන සිත අරමුණුකොට අනන්ත වශයෙන් භාවනාකරණ කල්හි එම භාවනාව මස්තක ප්‍රාප්ත වීමෙන් උපෙක්ඛා-ඒකග්ගතා යන අඞ්ග දෙකකින් යුක්තව පහළවන්නේ විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය යි. ඒ ධ්‍යානය හා එකට යෙදී උපදින කුසල්සිත **විඤ්ඤාණඤ්චායතන කුසල් සිත ය.**

ආකාසානඤ්චායතන කුසල්සිතෙහි 'නැත' යන අභාවප්‍රඥප්තිය † අරමුණු කොට කිසිවක් නැතැ යි භාවනා කරණ කල්හි එම භාවනාව මුදුන්පත්වීමෙන් උපෙක්ඛා–ඒකග්ගතා යන අඞ්ග දෙකින් යුක්තව පහළ වන්නේ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය යි. ඒ ධ්‍යානය හා එකට යෙදී උපදින කුසල්සිත **ආකිඤ්චඤ්ඤායතන කුසල් සිත ය.**

ආකිඤ්චඤ්ඤායතන සිත අරමුණුකොට එය "ශාන්තය ප්‍රණීතය" යි භාවනා කරණ කල්හි එම භාවනාව සම්පූර්ණ වීමෙන් උපෙක්ඛා–ඒකග්ගතා යන අඞ්ග දෙකකින් යුක්තව පහළ වන්නේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය යි. ඒ ධ්‍යානය හා එකට යෙදී උපදින කුසල්සිත **නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල් සිතය.**

[මේ අරූපාවචර කුසල්සිත සිවුවැදෑරුම් වන්නේ අතික්කමිතබ්බ = ඉක්ම වියයුතු ආරම්මණයන්ගේත් ආලම්බිතබ්බ = අරමුණු කළයුතු ආරම්මණයන්ගේත් ප්‍රභේදයෙනි. ඒ මෙසේයි:—

ආකාසානඤ්චායතන සිත රූපාවචර පඤ්චමධ්‍යාන යම් අරමුණුවූ කසිණනිමිත්ත ඉක්මවා එය සිතින් අත්හැර ලත් අහස අරමුණු කරයි.

විඤ්ඤාණඤ්චායතන සිත ඒ අහසද ඉක්මවා එය අරමුණුකොට උපන් ආකාසානඤ්චායතන සිත අරමුණු කරයි.

---

† විඤ්ඤාණඤ්චායතනය උපදවාගත් කල්හි ආකාසානඤ්චායතන ධ්‍යානය හෝ එම සිත අභාවයට යන්නේය යි වරදවා තේරුම් නොගත යුතුය. එය සහමුලින් අභාවයට ගියහොත් නැවත එයට සමවදින්ට නොහැකිය. මෙහි 'කිසිවක් නැත' යනු භාවනානුයෝගියා විසින් ඒ ආකාසානඤ්චායතන සිත ගැන මෙනෙහි නොකොට සිතින් අතහැර දමා නැත'යන ප්‍රඥප්ති මාත්‍රය මෙනෙහි කොට ගැනීමය. උපමාවක්– දිනපතා පාඨශාලාවට පැමිණෙන ශිෂ්‍යයෙක් යම් කිසි කරුණක් නිසා එක් දිනක එහි පැමිණියේ නැත. එදින පංක්තිය භාර ගුරුතුමා අසවල් ලමයා ඉන්නවාද යි ප්‍රශ්න කළවිට 'නැත' යන උත්තරය ලැබුනේය. මෙහි නැත යන්නෙන් ලමයා මළේය යි අදහස් නොකරන්නාක් මෙන් ආකාසානඤ්චායතන සිත සහමුලින් නැතිවූ බව දතයුතු ය.

ආකිඤ්චඤ්ඤායතන සිත ආකාසානඤ්චායතන සිත ද ඉක්මවා එහි අභාවය වූ නාස්තිභාව ප්‍රඥප්තිය අරමුණු කරයි.

නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිත ඒ නාස්තිභාව ප්‍රඥප්තිය ද ඉක්මවා එය අරමුණුකොට උපන් ආකිඤ්චඤ්ඤායතන සිත අරමුණු කරයි. ]

අරූපාවචර කුසල් සිත් හතර ලැබෙන්නේ ත්‍රිහේතුක පෘථග්ජනයාට ත්=රහතුන් වහන්සේ හැර සෙසු ඒලා- වලට පැමිණි ශෛක්‍ෂයන්ටත් ය.

## 18 වැනි පාඩම.

## අරූපාවචර විපාක සිත් සතර.

---

1 ආකාසානඤ්චායතන විපාක සිත.
2 විඤ්ඤාණඤ්චායතන විපාක සිත.
3 ආකිඤ්චඤ්ඤායතන විපාක සිත.
4 නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක සිත.

මේ සිත් හතර අරූපාවචර කුසලයන්ගේ ලා කාලයේ ඉක්ම ගොස් පැසුණු අවස්ථාවෙන් යුක්තව උපදනා විපාක සිත් ය. මොවුහු ආකාසානඤ්චායතන භූමිය ආදී භූමි සතරෙහි පිළිසිඳීම් ආදී වශයෙන් සුදුසු පරිදි ඉහත කී පුද්ගලයන් සතරදෙනා තුළ කුසල් සිත් වලට සමානව ම උපදිත්.

## අරූපාවචර කිරියසිත් සතර.

1 ආකාසානඤ්චායතන කිරිය සිත.
2 විඤ්ඤාණඤ්චායතන කිරිය සිත.
3 ආකිඤ්චඤ්ඤායතන කිරිය සිත.
4 නෙවසඤ්ඤානාසඤ්ඤායතන කිරිය සිත.

මේ අරූපාවචර කිරියසිත් හතර ලැබෙන්නේ රහතුන් වහන්සේට ම ය.

තවද, රහතුන්ට සහ බුදු-පසේබුදුවරයන්ටත් අරූප ධ්‍යානවලට සමවැදීමේ දී උපදින්නේත් මේ ක්‍රියා සිත් සතරය.

මේ සිත් දොළොස උපෙක්ඛා-ඒකග්ගතා යන ධ්‍යානාඞ්ග දෙකින් යුක්තය. මේ සිත් 12 ම උපෙක්‍ෂා සහගත්ය. සම්ප්‍රයුක්තය. සසඞ්ඛාරිකය.

කිරිය සිත් 20 — කිරිය සිත් විස්සකි. එනම්:—අහේතුක කිරිය සිත් 3 ය, සහේතුක කාමාවචර කිරිය සිත් 8 ය, රූපාවචර කිරිය සිත් 5 ය, අරූපාවචර කිරිය සිත් 4 ය යන මොහු ය. මොවුන්ට කිරියසිත් යයි කියනු ලබන්නේ කිරීම් පමණක් ඇති නිසා ය. කුසලාකුසලයන් මෙන් විපාක කිසිවක් නූපදවන-ක්‍රියා මාත්‍රයකින් අවසන් වී යන සිත් ය යනු තේරුම යි.

[භවයාගේ මුල්* නොකැපූ සන්තානයෙහි ද හට ගන්නා ආවජ්ජන සිත් දෙක එනාහි සමාන සිතක සේවනය් නොමැති ව දුර්වල වූ බැවින් ගෙඩි නූපදවන බොරු මල් මෙන් විපාක නූපදවත්.

භවයාගේ මුල් කැපූ රහත් සන්තානයෙහි උපදනා ඉතිරි කිරිය සිත් 18 වූ කලී මුල් කැපූ ගස්වල, වැල්වල පිපෙන මල්, ඵල නූපදවන්නාක්මෙන් විපාක නොදෙත්.]

---

* භවයාගේ මූල් නම් අවිජ්ජාව හා තණ්හාව ය.

| 6<br>[ අරූපාවචර සිත් 12 හි ස්වරූප වින්‍යාසය. | සොම්නස් සහ: සිත් | දොම්නස් සහ: ,, | උපේක්ෂා සහ: ,, | සම්ප්‍රයුක්ත ,, | විප්‍රයුක්ත ,, | අසංස්කාරික ,, | සසංස්කාරික ,, | ප්‍රථමධ්‍යාන ,, | ද්විතීයධ්‍යාන ,, | තෘතීයධ්‍යාන ,, | චතුර්ථධ්‍යාන ,, | පඤ්චමධ්‍යාන ,, |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කුසල් සිත් 4 | 0 | 0 | 4 | 4 | 0 | 0 | 4 | 0 | 0 | 0 | 0 | 4 |
| විපාක ,, 4 | 0 | 0 | 4 | 4 | 0 | 0 | 4 | 0 | 0 | 0 | 0 | 4 |
| කිරිය ,, 4 | 0 | 0 | 4 | 4 | 0 | 0 | 4 | 0 | 0 | 0 | 0 | 4 |
| අරූපාවචර ,, 12 | 0 | 0 | 12 | 12 | 0 | 0 | 12 | 0 | 0 | 0 | 0 | 12 |

රූපාවචරසිත් 15 ත් අරූපාවචර සිත් 12 ත් එකතු කළවිට සිත් විසිහතක් 27 වේ. මේ සිත් විසිහත උපචාර භාවනා අර්පණාභාවනා කරණකොට මහත් බවට පැමිණි හෙයින් "මහග්ගත" යන නම කියනු ලැබේ.† කාමාවචර සිත්වලට වඩා මහත් බවට උතුම්බවට පැමිණි සිත්ය යනු තේරුම යි.

| | | |
|---|---|---|
| සොම්නස් සහගත සිත් 12 | ප්‍රථමධ්‍යාන සිත් 3<br>ද්විතීයධ්‍යාන සිත් 3<br>තෘතීයධ්‍යාන සිත් 3<br>චතුර්ථධ්‍යාන සිත් 3 | මහග්ගත සිත් 27 යි. |
| උපෙක්ඛා සහගත සිත් 15 | පඤ්චමධ්‍යාන සිත් 15 | |

† උපචාරඅප්පනා-භාවනායෙන් මහත්වූ සත්විසි රූ'අරූසිත්-මහග්ගතාය යි කියති.

| 7 [ මහග්ගත සිත් 27 හි ස්වරූප ප්‍රභේද වින්‍යාසයයි. | | සෞමනස්සයුත: සිත් | දෞර්මනස්සයුත: ,, | උපේක්ෂායුත: ,, | ඥාණයුක්ත ,, | ඥාණවිප්‍රයුක්ත ,, | අසංස්කාරික ,, | සසංස්කාරික ,, | ප්‍රථමධ්‍යාන ,, | ද්විතීයධ්‍යාන ,, | තෘතීයධ්‍යාන ,, | චතුර්ථධ්‍යාන ,, | පඤ්චමධ්‍යාන ,, |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කුසල් සිත් | 9 | 4 | 0 | 5 | 9 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 5 |
| විපාක ,, | 9 | 4 | 0 | 5 | 9 | 0 | 0 | 9 | 1 | 1 | 1 | 1 | 5 |
| කිරිය ,, | 9 | 4 | 0 | 5 | 9 | 0 | 0 | 9 | 1 | 1 | 1 | 1 | 5 |
| මහග්ගත ,, | 27 | 12 | 00 | 15 | 27 | 00 | 00 | 27 | 3 | 3 | 3 | 3 | 15 |

මහග්ගත සිත් 27 නිමි.

## 19 වැනි පාඩම.

# ලෝකෝත්තර චිත්තය.

---

කුසල් සිත් සතරය, විපාක සිත් සතරය යි ලෝකෝත්තර චිත්තය අටවැදෑරුම් වේ.

### ලෝකෝත්තර කුසල්සිත් 4.

---

1 සෝතාපත්තිමාර්ග සිත.
2 සකෘදාගාමි මාර්ග සිත.
3 අනාගාමි මාර්ග සිත.
4 අරහත්ත මාර්ග සිත.

මේ සිත් හතර ලෝකෝත්තර කුසල් ය. මොවුන්ට මාර්ග සිත් යනු ද නමකි. නිවන් අරමුණුකොට මේ සිත් උපදී.

කෙලෙස් නසන අර්ථයෙන් හෝ නිවන් සොයන අර්ථයෙන් සම්මාදිට්ඨි ආදී අඞ්ග අටක් එකට එකතු වූ කල්හි එයට මාර්ග යයි කියනු ලැබේ. එනම්:—නිවණට පමුණුවන මාර්ගය මැයි. ඒ මාර්ගය හා එක්ව යෙදෙන සිත් මාර්ගසිත් ය.

සෝතාපත්ති=සෝත+ආපත්ති යන මෙහි **සෝත** නම් වේගයෙන් ගලා යන ජලය මුහුද කරා ම ගලා යන්නාක් මෙන් නිර්වාණය දක්වා ම ගලා—පවත්නා ආර්ය්‍ය අෂ්ටාංගික මාර්ගය යි. සෝවාන් ආදී ආර්ය්‍යපුද්ගලයන්ට අයත් අඞ්ග අටක් ඇති මාර්ගය† ආර්ය්‍යඅෂ්ටාංගික මාර්ගය යි කියනු ලැබේ. **ආපත්ති** යනු පළමුකොට පැමිණීම යි. ඒ සෝතයට පළමුකොට පැමිණීමෙන් ලැබෙන අඞ්ග අටක් ඇති මාර්ගය **සෝතාපත්ති මාර්ගය** යි. ඒ සෝතාපත්තිමාර්ගය හා එක්ව යෙදුනු සිත **සෝතාපත්ති මාර්ග සිත** ය.

**සකෘදාගාමි** = සකිං+ආගාමි; = වරක්+එන්නා යනු උත්පත්ති වශයෙන් එක්වරක් කාම ලෝකයට එන තැනැත්තාය. ඔහුගේ අඞ්ග අටක් ඇති මාර්ගය **සකෘදාගාමි මාර්ගය** යි. ඒ සකෘදාගාමි මාර්ගය හා එක්ව යෙදුනු සිත **සකෘදාගාමි මාර්ග සිත** ය. සකෘදාගාමි පුද්ගලයාගේ කාම ලෝකයට ඊම වනාහි පුද්ගල ස්වභාවය නිසා නොව ක්ලෙශ ස්වභාවය නිසා සිදුවන්නේ ය යි දතයුතු.

**අනාගාමි**=න+අන්+ආගාමි: නො+එන්නා යනු උත්පත්ති වශයෙන් කාම ලෝකයාට නො එන තැනැත්තා ය. ඔහුගේ අඞ්ග අටක් ඇති මාර්ගය **අනාගාමි මාර්ගය** යි. ඒ අනාගාමි මාර්ගය හා එක්ව යෙදුනු සිත **අනාගාමි මාර්ග සිතය**.

**අරහත්ත** යනු **රහත්බව ය**. එනම්, සුදුසු බව හෝ කෙලෙස් නැති බව හෝ පව් නොකරන බව ය. ඒ රහත් බව පිළිබඳ අඞ්ග අටක් ඇති මාර්ගය **අරහත්ත මාර්ගය** යි. ඒ අරහත්ත මාර්ගය හා එක්ව යෙදුනු සිත **අරහත්ත මාර්ග සිතය**.

---

† **1. සම්මාදිට්ඨි, 2. සම්මාසංකප්ප, 3. සම්මාවාචා, 4. සම්මාකම්මන්ත, 5. සම්මාආජීව, 6. සම්මාවායාම, 7. සම්මාසති, 8. සම්මාසමාධි.**

කුසලයන්ගේ කෘත්‍යය.

කුසලයන්ට අයත් ප්‍රධාන කෘත්‍යය නම් කෙලෙස් පහකිරීම ය– නැසීම ය. තදඞ්ග ප්‍රහාණය, විෂ්කම්භනප්‍රහාණය, සමුච්ඡේද ප්‍රහාණ ය යි කෙලෙස් පහකිරීම්– නැසීම් තුණකි. කාමාවචර කුසලය ටිකවේලාවකට පමණක් ලෙඩ සුවකරන බෙහෙතක් මෙනි. ඒ කුසලයෙන් කෙලෙස් නැසීම **තදඞ්ග ප්‍රහාණ** ය යි.

රූපාවචර– අරූපාවචර සඞ්ඛ්‍යාත මහද්ගත කුශලය කලකට පමණක් ලෙඩ සුවකරන බෙහෙතක් මෙනි. ඒ කුශලයෙන් කෙලෙස් නැසීම **විෂ්කම්භන ප්‍රහාණ ය යි.**

ලෝකෝත්තර කුශලය සහමුලින් රෝග නිදානයත් සමග ලෙඩ සුවකරන බෙහෙතක් මෙනි. ඒ කුශලයෙන් කෙලෙස් නැසීම **සමුච්ඡේද ප්‍රහාණ ය** යි.

## ලෝකෝත්තර විපාක සිත් හතර.

---

1 **සෝතාපත්ති ඵලසිත.**
2 **සකෘදාගාමි ඵලසිත.**
3 **අනාගාමි ඵලසිත.**
4 **අරහත්ත ඵලසිත.**

මේ සතර ලෝකෝත්තර විපාක සිත් ය. මොවුහු ගඟක වහාම හටගන්නා ඵලවර්ගයක් මෙන් මහානුභාව සම්පන්න වූ මාර්ග කුශලයන්ට අනතුරුව ම එයට විපාක වශයෙන් උපදනා බැවින් ඵලසිත් ය යි කියනු ලැබෙත්. ධර්මගුණ පාඨයෙහි එන "**අකාලික**" යනුවෙන් කියවෙන වහා ලැබෙන විපාක ද මෙය මැයි.

සෝතාපත්තිමාර්ග සිතට අනතුරුව ම එයට විපාක වශයෙන් උපදින්නේ **සොතාපත්ති ඵල සිත ය.**

සකෘදාගාමි මාර්ගසිතට අනතුරුව ම එයට විපාක වශයෙන් උපදින්නේ **සකෘදාගාමි ඵලසිත** ය

අනාගාමි මාර්ග සිතට අනතුරුව ම එයට විපාක වශයෙන් උපදින්නේ **අනාගාමි ඵලසිත** ය.

අරහත්ත මාර්ගසිතට අනතුරුව ම එයට විපාක වශයෙන් උපදින්නේ **අරහත්ත ඵලසිත** යි. මේ සිත් ද නිවන් අරමුණු කොට උපදී.

ලෝකෝත්තර කිරියසිත් නැත. ඒ ඒ මාර්ග සිත එක් වරක් ම උපදනා බැවිනි. මාර්ග සිත එක්වරක් උපදනේ ම ඒ මගින් පහකළයුතු කෙලෙස් නැවත නූපදනා සේ සහමුලින් නසයි. වෘක්ෂ ලතාදිය මුලුත් සමග උදුරා ලන හෙන පහරක් මෙනි.

ලෝකෝත්තර කුසල්සිත් ලැබෙන්නේ මාර්ගස්ථ පුද්ගලයන් සතරදෙනාට යි. එම විපාකසිත් ලැබෙන්නේ ඵලස්ථ පුද්ගලයන් සතරදෙනාට යි.

ස්වරූප බෙදීම.

[ ස්වරූප බෙදීමේ දී මේ ලෝකෝත්තරසිත් අට වේදනා වශයෙන් බෙදන කල්හි- සොම්නස් සහගත සිත් අට යි. උපේක්ෂා සහගත සිත් අට යයි බෙදිය යුතු. ඒ දෙවිධියෙන් ම ලැබෙන බැවිනි. තවද මේ සිත් අට ම සම්ප්‍රයුක්තය. සසඞ්ඛාරිකය. ]

8

[ ලෝකෝත්තර සිත් අටේ ස්වරූප වින්‍යාසය.

| | | | සොම්නස් සහගත සිත් | දොම්නස් සහගත ,, | උපේක්ෂා සහගත ,, | සම්ප්‍රයුක්ත ,, | විප්‍රයුක්ත ,, | අසංඛාරික ,, | සසංඛාරික ,, |
|---|---|---|---|---|---|---|---|---|---|
| කුසල් | සිත් | 4 | 4 | 0 | 4 | 4 | 0 | 0 | 4 |
| විපාක | ,, | 4 | 4 | 0 | 4 | 4 | 0 | 0 | 4 |
| ලෝකෝත්තර | ,, | 8 | 8 | 0 | 8 | 8 | 0 | 0 | 8 ] |

| | | | |
|---|---|---|---|
| [කාමාවචර | සිත් | 54 | භූමිභේදයෙන් සිත් 89. |
| රූපාවචර | ,, | 15 | |
| අරූපාවචර | ,, | 12 | |
| ලෝකෝත්තර | ,, | 8 | |

| | | | |
|---|---|---|---|
| අකුසල් | සිත් | 12 | ජාතිභේදයෙන් සිත් 89. |
| කුසල් | ,, | 21 | |
| විපාක | ,, | 36 | |
| කිරිය | ,, | 20 | |

| | | | |
|---|---|---|---|
| අහේතුක | සිත් | 18 | අහේතුක සහේතුක භේදයෙන් සිත් 89. |
| සහේතුක | ,, | 71 | |

| | | | |
|---|---|---|---|
| ලෞකික | සිත් | 81 | ලෞකික ලෝකෝත්තර භේදයෙන් සිත් 89 |
| ලෝකෝත්තර | ,, | 8 | |

| | | | |
|---|---|---|---|
| අසෝභන | සිත් | 30 | අසෝභන සෝභන භේදයෙන් සිත් 89. |
| සෝභන | ,, | 59 | |

| | | | |
|---|---|---|---|
| කාම | සිත් | 54 | සිත් 89. |
| මහග්ගත | ,, | 27 | |
| ලෝකෝත්තර | ,, | 8 | |

| | | | |
|---|---|---|---|
| සුඛසහගත | සිත් | 1 | වේදනා භේදයෙන් සිත් 89 † (ඉන්ද්‍රිය වශයෙනි) |
| සොම්නස්සහගත | ,, | 38 | |
| දුක්ඛ සහගත | ,, | 1 | |
| දොම්නස් සහගත | ,, | 2 | |
| උපේක්‍ෂා සහගත | ,, | 55 | |

| | | | |
|---|---|---|---|
| සුඛසහගත | සිත් | 39 | වේදනාභේදයෙන් සිත් 89 † (අනුභවන වශයෙනි.) ] |
| දුක්ඛසහගත | ,, | 3 | |
| උපේක්‍ෂාසහගත | ,, | 55 | |

---

† ලෝකෝත්තර සිත් 8 දෙවරක් ගත් නිසා 8 ක් අඩුකොට ගත්කල 89 ක් වේ. මෙය 'අගහිතගහණ' ක්‍රමය යි.

| 9<br>[සිත් 89 යෙහි ස්වරූප වින්‍යාසය. | | සුඛසහගත සිත් | සෝමනස්සසහගත ,, | දුක්ඛසහගත ,, | දෝමනස්සසහගත ,, | උපේක්ෂාසහගත ,, | සම්ප්‍රයුක්ත ,, | විප්‍රයුක්ත ,, | අසංස්කාරික ,, | සසංස්කාරික ,, |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| කාමාවචර | සිත් 54 | 1 | 18 | 1 | 2 | 32 | 20 | 34 | 37 | 17 |
| රූපාවචර | ,, 15 | – | 12 | – | – | 3 | 15 | – | – | 15 |
| අරූපාවචර | ,, 12 | – | – | – | – | 12 | 12 | – | – | 12 |
| ලෝකෝත්තර | ,, 8 | – | 8 | – | – | 8 | 8 | – | – | 8 |
| අකුසල් | ,, 12 | – | 4 | – | 2 | 6 | 8 | 4 | 7 | 5 |
| කුසල් | ,, 21 | – | 12 | – | – | 13 | 17 | 4 | 4 | 17 |
| විපාක | ,, 36 | 1 | 13 | 1 | – | 5 | 17 | 19 | 19 | 17 |
| කිරිය | ,, 20 | – | 9 | – | – | 11 | 13 | 7 | 7 | 13 |
| අහේතුක | ,, 18 | 1 | 2 | 1 | – | 14 | – | 18 | 18 | – |
| සහේතුක | ,, 71 | – | 36 | – | 2 | 41 | 55 | 16 | 19 | 52 |
| ලෞකික | ,, 81 | 1 | 30 | 1 | 2 | 47 | 47 | 34 | 34 | 44 |
| ලෝකෝත්තර | ,, 8 | – | 8 | – | – | 8 | 8 | – | – | 8 |
| සිත් | 89 | 1 | 38 | 1 | 2 | 55 | 55 | 34 | 37 | 52 |

**සිත් 89 නිමි. ]**

20 වැනි පාඩම.

## ලෝකෝත්තර සිත් සතළිහ. (40)

සංක්ෂිප්ත ලෝකෝත්තර සිත් අට අතුරෙන් එක් එක් සිතක් ධ්‍යානාඞ්ගයන් හා එක්ව යෙදීමේ භේදයෙන් පස් පස් වැදෑරුම් වීමෙන් ලෝකෝත්තර සිත් සතළිහක් 40 ක් වන්නේය. ඒ මෙසේ යි:—

**කුසල් සිත් 20.**

1 **විතක්ක විචාර පීති සුඛ ඒකග්ගතා සහිත පඨමජ්ඣාන සෝතාපත්තිමාර්ගී සිත.**

2 **විචාර පීති සුඛ ඒකග්ගතා සහිත දුතියජ්ඣාන සෝතාපත්තිමාර්ගී සිත.**

3 **පීති සුඛ ඒකග්ගතා සහිත තතියජ්ඣාන සෝතාපත්තිමාර්ගී සිත.**

4 **සුඛ ඒකග්ගතා සහිත චතුත්ථජ්ඣාන සෝතාපත්තිමාර්ගී සිත.**

5 **උපෙක්ඛා ඒකග්ගතා සහිත පඤ්චමජ්ඣාන සෝතාපත්තිමාර්ගී සිත.**

මෙසේ සෝතාපත්තිමාර්ගී සිත පස්වැදෑරුම් වේ. එසේම සකෘදාගාමිමාර්ගී සිත ද, අනාගාමිමාර්ගී සිත ද, අරහත්තමාර්ගී සිත ද පස් පස් වැදෑරුම්ව ලෝකෝත්තර මාර්ගීසිත් විස්සෙක් වේ.

## ඵල සිත් 20.

1 විතක්ක විචාර පීති සුඛ ඒකග්ගතා සහිත පඨමජ්ඣාන සෝතාපත්ති ඵලසිත.

2 විචාර පීති සුඛ ඒකග්ගතා සහිත දුතියජ්ඣාන සෝතාපත්තිඵල සිත.

3 පීති සුඛ ඒකග්ගතා සහිත තතියජ්ඣාන සෝතාපත්තිඵල සිත.

4 සුඛ ඒකග්ගතා සහිත චතුත්ථජ්ඣාන සෝතාපත්තිඵල සිත.

5 උපෙක්ඛා ඒකග්ගතා සහිත පඤ්චමජ්ඣාන සෝතාපත්තිඵල සිත.

මෙසේ සෝතාපත්තිඵලසිත පස්වැදෑරුම් වේ. එසේම සකදාගාමිඵලසිත ද, අනාගාමිඵලසිත ද, අරහත්තඵල සිත ද, පස් පස් වැදෑරුම් ව ලෝකෝත්තර ඵලසිත ද විස්සෙක් වේ.

මේ ලෝකෝත්තර සිත් සතළිස ය. මෙසේ සතළිස් ආකාරයකින් ලෝකෝත්තර සිත් ලැබෙන්නේ ලෞකික ධ්‍යාන ලැබූ පුද්ගලයන්ටය. සංක්ෂේප ලෝකෝත්තර සිත් අට ලැබෙන්නේ ලෞකිකධ්‍යාන නො ලැබූ පුද්ගලයන්ට ය.

| | | |
|---|---|---|
| විස්තර ලෝකෝත්තර සිත් 40. | ප්‍රථමධ්‍යාන සිත් 8 | සුඛසහගත සිත් 32. |
| | ද්විතියධ්‍යාන සිත් 8 | |
| | තෘතියධ්‍යාන සිත් 8 | |
| | චතුර්ථධ්‍යාන සිත් 8 | |
| | පඤ්චමධ්‍යානසිත් 8 | උපෙක්ඛාසහගත සිත් 8. |

| | | |
|---|---|---|
| මහග්ගත ලෝකෝත්තර සිත් 67 | ප්‍රථමධ්‍යාන සිත් 11 | සුඛසහගත සිත් 44. |
| | ද්විතීයධ්‍යාන සිත් 11 | |
| | තෘතීයධ්‍යාන සිත් 11 | |
| | චතුර්ථධ්‍යාන සිත් 11 | |
| | පඤ්චමධ්‍යාන සිත් 23 | උපේක්ෂාසහගත සිත් 23. |

| | | |
|---|---|---|
| කාමාවචර සිත් | 54 | භූමිභේදයෙන් සිත් 121. |
| රූපාවචර සිත් | 15 | |
| අරූපාවචර සිත් | 12 | |
| ලෝකෝත්තර සිත් | 40 | |

| | | |
|---|---|---|
| අකුසල් සිත් | 12 | ජාතිභේදයෙන් සිත් 121. |
| කුසල් සිත් | 37 | |
| විපාක සිත් | 52 | |
| කිරිය සිත් | 20 | |

| | | |
|---|---|---|
| සුඛසහගත සිත් | 1 | වේදනාභේදයෙන් සිත් 121. (ඉන්ද්‍රිය වශයෙනි) |
| සොම්නස්සහගත සිත් | 62 | |
| දුක්ඛසහගත සිත් | 1 | |
| දොම්නස්සහගත සිත් | 2 | |
| උපේක්ෂාසහගත සිත් | 55 | |

| | | |
|---|---|---|
| සුඛසහගත සිත් | 63 | වේදනාභේදයෙන් සිත් 121. (අනුභවන වශයෙනි) |
| දුක්ඛසහගත සිත් | 3 | |
| උපේක්ෂාසහගත සිත්] | 55 | |

| | | |
|---|---|---|
| අහේතුක සිත් | 18 | අහේතුක සහේතුක භේදයෙන් සිත් 121. |
| සහේතුක සිත් | 103 | |
| ලෞකික සිත් | 81 | ලෞකික ලෝකෝත්තර භේදයෙන් සිත් 121. ] |
| ලෝකෝත්තර සිත් | 40 | |

| 10 [ සිත් 121 හි ස්වරූප විභාගය, | | | සුඛසහගත සිත් | සොමනස්සසහගත ,, | දුක්ඛසහගත ,, | දොමනස්සසහගත ,, | උපේක්ෂාසහගත ,, | සම්ප්‍රයුක්ත ,, | විප්‍රයුක්ත ,, | අසංඛාරික ,, | සසංඛාරික ,, |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කාමාවචර | සිත් | 54 | 1 | 18 | 1 | 2 | 32 | 20 | 34 | 37 | 17 |
| රූපාවචර | ,, | 15 | – | 12 | – | – | 3 | 15 | – | – | 15 |
| අරූපාවචර | ,, | 12 | – | – | – | – | 12 | 12 | – | – | 12 |
| විස්තර ලෝකෝත්තර | ,, | 40 | – | 32 | – | – | 8 | 40 | – | – | 40 |
| කුසල් | ,, | 37 | – | 24 | – | – | 13 | 33 | 4 | 4 | 33 |
| අකුසල් | ,, | 12 | – | 4 | – | 2 | 6 | 8 | 4 | 7 | 5 |
| විපාක | ,, | 52 | 1 | 25 | 1 | – | 5 | 33 | 1 | 19 | 33 |
| කිරිය | ,, | 20 | – | 9 | – | – | 11 | 13 | 7 | 7 | 13 |
| අහේතුක | ,, | 18 | 1 | 2 | 1 | – | 14 | – | 18 | 18 | – |
| සහේතුක | ,, | 103 | – | 60 | – | 2 | 41 | 87 | 16 | 19 | 84 |
| ලෞකික | ,, | 81 | 1 | 30 | 1 | 2 | 47 | 47 | 34 | 37 | 44 |
| ලෝකෝත්තර | ,, | 40 | – | 32 | – | – | 8 | 40 | – | – | 40 |
| සිත් සියල්ල | | 121 | 1 | 62 | 1 | 2 | 55 | 87 | 34 | 37 | 84 |

| 11 [ මහද්ගත ලෝකෝත්තර සිත් 67 හි ස්වරූප විභාගය (ධ්‍යාන භෙදයෙනි.) | | | සොමනස්සසහගත සිත් | දොමනස්සසහගත ,, | උපෙක්ඛාසහගත ,, | අසංඛාරික ,, | සසංඛාරික ,, | සම්ප්‍රයුක්ත ,, | විප්‍රයුක්ත ,, |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රථමධ්‍යාන | සිත් | 11 | 11 | – | – | – | 11 | 11 | – |
| ද්විතීයධ්‍යාන | ,, | 11 | 11 | – | – | – | 11 | 11 | – |
| තෘතීයධ්‍යාන | ,, | 11 | 11 | – | – | – | 11 | 11 | – |
| චතුර්ථධ්‍යාන | ,, | 11 | 11 | – | – | – | 11 | 11 | – |
| පඤ්චමධ්‍යාන | ,, | 23 | – | – | 23 | – | 23 | 23 | – |
| මහද්ගත ලෝකෝත්තර | ,, | 67 | 44 | – | 23 | – | 67 | 67 | – ] |

**සිත් 121 නිමි.**

---

කොළඹ දෙමටගොඩ මහා විශුද්ධාරාම ත්‍රිපිටක විද්‍යාලයාධිපති **ආචාර්ය්‍ය දෙව්නුවර ඤාණාවාස ස්වාමීන්** විසින් සංග්‍රහකළ **අභිධර්මය** නම් පොතෙහි **චිත්ත-කාණ්ඩය යි.**

කත්තු සමාසංසනා

ඉමිනා මෙ තනු හො තනු-කිලෙසා අනුපීළිකා,
භවෙය්‍යං සීලවා සද්ධො-පඤ්ඤවා සුසමාහිතො.]

---